ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්සෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය සහ නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටීන් පිළිබඳ නිර්දේශිත මාර්ගෝපදේශන

**2023**

**සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්ඝෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය සහ නීති ක්‍රියාත්මක කරනු ලබන නිලිධාරින් විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටීන් පිළිබඳ නිර්දේශිත මාර්ගෝපදේශනය සකසනු ලැබුවේ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 (ඇ) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසිනි (කොමිසම,ශ්‍රී.ල.මා.හි.කො.ස)**

**සභාපතිතුමියගේ පණිවිඩය**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවෙහි 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර, එහි ඇති ව්‍යතිරේකයන්ට යටත්ව, සුරක්ෂා කොට ඇති සාමකාමීව උද්ඝෝෂණය කිරීමට ඇති අයිතිය කොමිසමට මෙන්ම මා හට පෞද්ගලිකවද පරම වැදගත්කමකින් යුතු කාරණයකි.ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය බලගැන්වීම ඉතාමත් වැදගත් සාධකයක් වන බව මා විශ්වාස කරන අතර මානව හිමිකම් සුරක්ෂිත කිරීමෙහි ලා එය දිරිගැන්වීමක්ද වේ, ඒ මන්ද යත්, ප්‍රජාතාන්ත්‍රවාදය සහ මානව හිමිකම් ස්වභාවයෙන්ම එකිනෙක හා බැදී පවතින නිසාවෙනි.

සිවිල් වැසියන් විසින් සිදු කරනු ලැබූ උද්ඝෝෂණයන්, විශේෂයෙන්ම 2022 වර්ෂයේ සිදු කරනු ලැබූවන් කොමිසම මගින් සුපරික්ෂාකාරී ලෙස අධීක්ෂණය කරනු ලැබීය.මේ සම්බන්ධව, කොමිසම හට උද්ඝෝෂණය කරනවුවන්ගෙන් පැමිණිලි අසන්නට ලැබුණු අතර උද්ඝෝෂණයන්හිදී උද්ගතවූ මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳව පරීක්ෂණ සිදු කිරීමද සිදුවිය.මෙවැනි අවස්ථාවන්හිදී නෛතික පිළියම් ලබා දීමට අමතරව කොමිසම උද්ඝෝෂණකරුවන්ගේ සාමකාමීව උද්ඝෝෂණය කිරීමට ඇති අයිතිය සුරක්ෂා කරනු වස් ප්‍රගාමී පියවරයන් අනුගමනය කිරීමට තීරණය කල අතර එමගින් අනාගතයේ උද්ඝෝෂණයන්හිදී විය හැකි ව්‍යවස්ථාපිතව පවතින මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම වැලක්වීමට පියවර ගන්නා ලදී.ඒ හේතුවෙන්, මා සාඩම්බරයෙන් යුතුව "සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්ඝෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී රාජ්‍ය සහ නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටීන් පිළිබඳ නිර්දේශිත මාර්ගෝපදේශන" ඉදිරිපත් කර සිටින අතර ශ්‍රී.ල.මා.හි.කො.ස විසින් නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හට මෙකී නිර්දේශිත උපදේශන මාලාව පිළිපැදීමට උනන්දු වන ලෙස ඉල්ලා සිටිනවා මෙන්ම ඒ සඳහා අප මාර්ගෝපදේශනය ලබා දීමට සැදී පැහැදී සිටින බවද ප්‍රකාශ කර සිටීමට කැමැත්තෙමි.මෙම නිර්දේශිත මාර්ගෝපදේශනයන් දේශීය නීති සහ ශ්‍රී ලංකාව අනුගමනය කිරීමට බැඳී සිටින්නාවූ මානව හිමිකම්, එනම් රජයක් වශයෙන් ක්‍රියාවෙහි යෙදවීමට වගකීමෙන් බැදී ඉන්නාවූ නියමයන් මත පදනම්ව සකස් කර ඇති අතර පවතින නීති භාවිතය සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව ඊට සමගාමීව මෙකී නිර්දේශිත මාර්ගෝපදේශනයන් ක්‍රියාවට නැංවීම තුලින් ඉහත සඳහන් අරමුණු උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීමට හැකි වන බව මා තරයේ විශ්වාස කරමි.

මෙහිදී, මා හිතවත් අනුසූයා ශන්මුගනාතන් මිය, පූජ්‍ය කලුපහන පියරතන හිමි, ආචාර්ය විජිත නානායක්කාර සහ ආචාර්ය නිමල් කරුණාසිරි යන කොමසාරිස්වරුන් මා වෙත දැක්වූ නොසැලෙන සහයෝගය වෙනුවෙන් ස්තූති කිරීමට මෙය අවස්තාවක් කරගන්නා අතර මාගේ හද පිරි ප්‍රණාමය කොමිෂන් සභාවෙහි ලේකම්තුමන් වන රංජිත් උයන්ගොඩ මහතාට සහ අතිරේක ලේකම් වන හේමා ධර්මවර්ධන මහත්මියටත් මෙම කර්තව්‍ය සාර්ථක ප්‍රයත්නයක් කරනු වස් වෙහෙස නොබලා කටයුතු කල මාගේ කාර්යමණ්ඩලයටද තුති පුද කර සිටිමි.

.......................................................................

විනිසුරු රෝහිනී මාරසිංහ මිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)

පටුන

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමියගේ පණිවිඩය……….……………………. iii
පටුන……..………………………………………………………………………………...V
**I. නිර්දේශිත මාර්ගෝපදේශනයෙහි අරමුණු …………………………………………..…..1**
**II. නිර්දේශිත මාර්ගෝපදේශනයෙහි විෂය පථය** ………………………………………………1
**III. සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතිය** ………………………………………………..…..2
I. නීතිය ආරක්ෂා කරනුයේ සාමකාමී එක්රැස්වීම් පමණි ………………………………2
II. සියලු පෙළපාළින් සාමකාමී බවට පූර්වානුමානය කරයි…………………………………

**IV. නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් විසින් සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතියට එරෙහිව ක්‍රියාත්මක කල හැකි අවසරලත් සීමාවන්……………………………………………..5**
**I කොටස: රාජ්‍ය සතු බැදියාවන්…………………………………………………………...7**

I. පොදු බැඳීයාවන් ……………………………………………………………..…....7
II. මුලික අයිතිවාසිකම් හා සබැදී බැඳීයාවන් ගෙන් නික්මීම ……………………..……..11
III. සීමාවන් පැනවීමෙහි ලා ඇති සාධන භාරය (Burden of Proof)……………………..…..12
IV. එක්රැස්වීමට ඇති අයිතිය සීමා කල හැකි ආකාර ……………………………………….12
V. සීමාවන් වර්ගීකරණය ……………………………………………………………14
VI. බලය භාවිතය (use of force) ……………………………………………………..16
VII. උද්සෝෂණයන්ට පෙර කරනු ලබන දැන්වීම් ……………………………………...17
VIII. අවදානම් සහිත සහ විශේෂ කාණ්ඩයන්ට අයත් පුද්ගලයන් කෙරෙහි සැලකිය යුතු අකාරය .19
**II කොටස: සිවිල් වැසියන් විසින් කරනු ලබන උද්සෝෂණ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටීන් පිළිබද නිර්දේශිත මාර්ගෝපදේශන…………………………………………………………………………19**

I. නීති ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් පිරිස් පාලනය කිරීම ………………………19
II. නීති ක්‍රියාත්මක කරනු ලබන නිලිධාරින්ගේ කාර්යභාර්ය ………………….…………21
III. අණ දෙන දූරාවලිය (chain of command) ……………………………………...24
IV. පෙර සූදානම් වීම සහ උපායික විකල්ප……………………………………..……30
V. උද්සෝෂණයන්හිදී අවදානම් සහිත සහ විශේෂ වර්ගීකරණයන්ට අයත් පුද්ගලයන් සම්බන්ධව කටයුතු කිරීම ……………………………………………………………………34
VI. රාජ්‍ය සතු දේපළයන්ට, පොදු හෝ පුද්ගලික දේපළයන්ට හානි පමුණුවමින් අපරාධමය වැරදි සිදු කිරීම සහ අනවසරයෙන් රැඳිසිටීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම……………………38
VII. ඇඳීරි නීතිය හෝ හදිසි නීතිය ක්‍රියාත්මකව ඇති අවස්ථාවක උද්සෝෂණයන් පවතින විට ක්‍රියාත්මක විය යුතු ආකාරය …………………………………………………..…..40
**III කොටස: ක්‍රියාවට නැංවීම ……………………………………………………………...41**

ඇමුණුම් ……………………………………………………………………..……43

**“Stifling the peaceful expression of legitimate dissent today can only result inexorably in the catastrophic explosion of violence some other day.”**
**“Democracy requires not merely that dissent is tolerated but that it be encouraged and that obligation of the Executive is expressly recognized by Article 4(d) so that the Police, too, must respect, secure and advance the right to dissent.”**
**(Amaratunga v Sirimal and Others (Jana Ghosha case) [1993] 1 Sri L.R., Mark Fernando J. Supreme Court, Sri Lanka)**

## I. නිර්දේශිත මාර්ගෝපදේශනයෙහි අරමුණු

1. ප්‍රජාතන්ත්‍රවාදය සුරකින සමාජයක ජාතික ආරක්ෂාව සහ පොදු විනය සුරකිනු පිණිස නීතිය මගින් නියම කොට ඇති නෛතික සීමාවන්ටද යටත්ව සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතිය පිළිගැනීම.(1978 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවෙහි 14(1)(ආ) ව්‍යවස්ථාව සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 21 වන වගන්තිය).

2. නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය සහ සුරක්ෂා කිරීම සඳහාත් සියලුදෙනාගේම මානව හිමිකම් සහ ව්‍යවස්ථාපිත මූලික අයිතිවාසිකම් සහතික කිරීම සඳහාත් රාජ්‍ය සතු සබැඳියාවන් ව්‍යවස්ථාව මගින් පිළිගැනීම.

3. ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කොට ඇති සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතිය සියලුදෙනා හටම බේදයකින් හා බියකින් තොරව බුක්ති විදීමට ඇති බව පිළිගැනීම.

4. සාමකාමී විරෝධතාවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී දේශීය නීති සහ අන්තර්ජාතිකව ශ්‍රී ලංකාව විසින් අනුගමනය කිරීමට බැදී සිටින්නාවූ මානව හිමිකම් වලට අනුකූලව, නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් කටුයුතු කරන බව සහතික කිරීම.

5. ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමටත් පිළිපැදීමටත් වගකීමක් ඇති බව ඇතුළුව, පුද්ගලයන්ට එකිනෙකා කෙරෙහි යුතුකම් සහ වගකීම්ද ඇති බව පිළිගැනීම.

## II. නිර්දේශිත මාර්ගෝපදේශනයෙහි විෂය පථය

1. මෙම නිර්දේශිත මාර්ගෝපදේශ ශ්‍රී ලංකා ව්‍යවස්ථාව මගින් පිළිගෙන සහ සහතික කර ඇති සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතිය හා බැඳි මූලික අයිතිවාසිකම් පුනර්වාචනය කර සිටියි.

2. එමගින් මෙහිදී මහජන විරෝධතා අතරතුර ඇතිවිය හැකි ප්‍රචණ්ඩත්වයන් වැළකීමට සහ අවධානයට ලක් කිරීමට අපේක්ෂා කරන අතර එමගින් ප්‍රධාන වශයෙන් රාජ්‍යයකටත්,

විශේෂයෙන්ම නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් සතුවත් තිබිය යුතු වගවීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

3. මෙම නිර්දේශිත මාර්ගෝපදේශනයෙහි ඇතුලත් ආකෘතිය වනුයේ;

3.1. කුමන වාතාවරණයක් තුල වුවද උද්ඝෝෂණකරුවන් වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකරන බවට ස්ථාපිත කල යුතු වීම (ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය).

3.2. උද්ඝෝෂණකරුවන් අත්නෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස් බව ස්ථාපිත කල යුතුවීම (ව්‍යවස්ථාවේ13(1),13(2),13(3),13(4),13(5) සහ 13(6) වන වගන්ති).ව්‍යවස්ථාවේ 13(5) සහ 13(6) වන වගන්ති මගින් සහතික කොට ඇති අයිතීන් නීති ප්‍රකාරව රටෙහි ජාතික ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් පමණක් සීමාවට ලක් කර ඇති බව වටහා ගැනීම.

3.3. සියලුම පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන බවත් නීතියේ රැකවරණයට කිසිදු භේදයකින් තොරව හිමිකම් ඇති බවත් තහවුරු කල යුතු වීම.මේ සම්බන්ධයෙන්, නීතියට අනුව ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි වැනි ඕනෑම හේතුවක් මත වෙනස් කොට සැලකීමට එරෙහිව කටයුතු කල යුතු අතර සියලු පුද්ගලයන්ට සමාන හා ඵලදායී ආරක්ෂාවක් ලබා දිය යුතු වීම (ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය).

3.4. සෑම පුරවැසියෙකුටම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇති බව සහ එකී අයිතියට සාමකාමීව රැස්වීමේ නිදහසද ඇතුලත් බව ස්ථාපිත කිරීම (ව්‍යවස්ථාවේ 14 (1)(අ) සහ (ආ)).

4. ඉහත අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නීතියෙන් නියම කර ඇති සීමාවන් වන ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව, මහජන සෞඛ්‍ය ආරක්ෂාව, වාර්ගික හා ආගමික සංහිඳියාව ආරක්ෂා කිරීම හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ අයිතිවාසිකම් හැර වෙනත් කිසිදු සීමාවක් නොපවතින බව මාර්ගෝපදේශනය මගින් සහතික කර පැහැදිලි කර දැක්වීම(ව්‍යවස්ථාවේ 15 (3) සහ 15 (7) වන වගන්තිය).

## III. සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතිය

### 1. නීතිය ආරක්ෂා කරනුයේ සාමකාමී එක්රැස්වීම් පමණි

1.1.විරෝධතා දැක්වීමේ අයිතිය යනු ප්‍රකාශනයේ නිදහස ඇතුළු විශ්වීය වශයෙන් පිළිගත් මානව අයිතිවාසිකමකි; සාමකාමීව රැස්වීමේ සහ ඇසුරේ නිදහස; පොදු කටයුතු මෙහෙයවීමට සහභාගී වීමට ඇති අයිතිය, සිතීමේ නිදහස, හෘදය සාක්ෂිය සහ ආගමික නිදහස; සංස්කෘතික ජීවිතයට සහභාගී වීමට ඇති අයිතිය, පුද්ගලයෙකුගේ ජීවිතයට ඇති අයිතිය, පෞද්ගලිකත්වය, නිදහස සහ ආරක්ෂාව; සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දක්වා ඇති වෙනස් කොට නොසැලකීමේ අයිතියද ඇතුලත් වේ. විරෝධතා

දැක්වීමේ අයිතිය ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් ඇතුළු සියලු මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ද අත්‍යවශ්‍ය වේ.

1.2. සාමකාමී විරෝධතා සඳහා ඇති අයිතිය යම් අවස්ථාවලදී සීමා විය හැකි බව ජාත්‍යන්තර නීතිය පිළිගනී.නීත්‍යානුකූල ඉලක්කයක් හඹා යාමේදී සීමා කිරීම ''අවශ්‍ය'' සහ ''සමානුපාතික'' බව සාධාරණීකරණය කිරීමේ වගකීම නිසි බලධාරීන් මත පවතී. ජාතික ආරක්ෂාව වැනි ''නීත්‍යානුකූල අරමුණක්'' සඳහා නීතියෙන් සීමාවන් නියම කර ඇති විටෙක හැර අදහස් ප්‍රකාශ කිරීමේ, රැස්වීමේ හෝ සංගමයේ නිදහස සඳහා කිසිදු සීමාවක් පැනවිය නොහැක (එවැනි සීමාවන් ක්‍රියාත්මක කර හැකි වනුයේ රටේ පැවැත්ම හෝ එහි භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම හෝ දේශපාලන ස්වාධීනත්වයට එරෙහිව විශ්වසනීය තර්ජනයක් හෝ යම් බාහිර හෝ අභ්‍යන්තර මූලාශ්‍රයකින් මගින් පැමිණිය හැකි බලය භාවිතා කිරීමකදී පමණි) මහජන සාමය, මහජන සෞඛ්‍යය, මහජන සදාචාරය සහ මහජන ආරක්ෂාව (සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය).

1.3. සාමකාමී විරෝධතා දැක්වීමේ අයිතිය ප්‍රචණ්ඩත්වය භාවිතයෙන් භුක්ති විදිය නොහැක.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාවේ සන්දර්භය තුළ ප්‍රචණ්ඩත්වය වශයෙන් හගවනුයේ සහභාගිවන්නන් වෙනත් අයට එරෙහිව ශාරීරික බලය යෙදවීම වන අතර එමඟින් තුවාල හෝ මරණය හෝ දරුණු දේපළ හානි සිදුවිය හැකිය.හුදෙක් තල්ලු කිරීම හෝ වැරෙන් තල්ලු කිරීම, අසභ්‍ය අභිනයන්, වාහන හෝ පදික ගමනාගමනයට බාධා කිරීම හෝ දෛනික ක්‍රියාකාරකම් සඳහා බාධා කිරීම ප්‍රචණ්ඩත්වය ලෙස සලකනු නොලැබේ [සාමකාමීව රැස්වීමේ අයිතිය පිළිබඳ සාමාන්‍ය විවරණ අංක 37 (2020) - (21 වන ව්‍යවස්ථාව)].

1.4. එක් විරෝධතාකරුවන් පිරිසක් තවත් විරෝධතාකරුවන් පිරිසක් සමඟ ගැටෙන විට ප්‍රති-පෙළපාලි ඇතිවිය හැක.ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියේ සඳහන් වන ආරක්ෂාවේ සීමාව තුළ විරෝධතාකරුවන් දෙපිරිසම සිටිනු ලැබේ.

1.5. උද්ඝෝෂණය සාමකාමීද යන්න විරෝධතාකරුවන්ගෙන් හටගන්නා කිසියම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් මාර්ගයෙන් තහවුරු කර ගත හැකිය.නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විරෝධතාවයකට ඇති කරන ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රකෝප කිරීම් සාමකාමී විරෝධතාව සාමකාමී නොවන විරෝධතාවක් බවට පත් නොකරනවාක් මෙන්ම ඒ හා සමානවම, මහජනතාව හෝ විරෝධතාකරුවන් ඉලක්ක කරගත් ප්‍රතිඋපසෝෂණයක සාමාජිකයින් විසින් කරන ලද කිසියම් ප්‍රචණ්ඩත්වයක් විරෝධතාව සාමකාමී නොවන විරෝධතාවක් බවට පත් නොකරයි.

1.6. වරින් වර වෙන් වෙන් වශයෙන් සිදුවන ප්‍රචණ්ඩත්වයන් හෝ අන් අය විසින් සිදු කරනු ලබන වෙනත් නීති විරෝධී ක්‍රියාවන්, විරෝධතා දක්වන්නන්ගේ චේතනාවන් සහ හැසිරීම් වල සාමකාමී භාවය පවතින තාක් විරෝධතාවක් නීති විරෝධී නොවේ.

1.7. විරෝධතාකරුවන්ගේ ආරම්භක කණ්ඩායම ඔවුන්ගේ චේතනාවන් හෝ හැසිරීම්හි සාමකාමී බව පවත්වා ගෙන යන්නේ නම් , ආරම්භක කණ්ඩායමේ සාමාජිකයන් නොවන ප්‍රචණ්ඩ චේතනා ඇති පිටස්තරයින් එක් වුවද, විරෝධතා දැක්වීමේ ආරම්භක කණ්ඩායමට ඇති අයිතිය උදුරා ගත නොහැක.

1.8.විරෝධතාව තුළ ප්‍රචණ්ඩත්වය පැහැදිලිව පැතිරී ඇති අවස්ථාවක (හුදෙකලා නොවන), එවැනි විරෝධතාවයක සහභාගීත්වය තවදුරටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය යටතේ ආරක්ෂා නොවනු ඇත.

1.9.ගෑස් ආවරණ හෝ හිස්වැසුම් වැනි දෑ රැගෙන යන සහභාගිවන්නන් එදිරිවාදීන් ලෙස නොසැලකිය යුතුය.එවැනි ක්‍රියාවන් අවි සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති මත පදනම්ව හෝ එවැනි ආයුධ මගින් එල්ල කළ හැකි ප්‍රචණ්ඩකාරීභාවය හා ප්‍රචණ්ඩත්වයේ අවදානම පිළිබඳ සාධාරණ සැකයක් පවතින්නේද යන්න සැලකිල්ලට ගනිමින් එක් එක් සිද්ධිය මත පදනම්ව තීරණය කළ යුතු වේ.

1.10. සිදුවීමට පෙර හෝ ඒ අතරතුර, එම සහභාගිවන්නන් ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමට අන් අයව පොළඹවන බවටත්,එවැනි ක්‍රියාවන් ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට ඉඩ ඇති බවත් හෝ සහභාගිවන්නන්ට ප්‍රචණ්ඩකාරී චේතනාවන් තිබූ බවත් ඔවුන් එකී ප්‍රචණ්ඩකාරිත්වය මත පිහිටා කටයුතු කිරීමට සැලසුම් කල බැවින් එකී සිද්ධිය උත්සන්න වීමට ආසන්නව තිබූ බවටත් බලධාරීන් විශ්වාස කළ හැකි සාක්ෂි (විශ්වාසනීය සාක්ෂි) ඉදිරිපත් කළ යුතුය.

1.11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ආ) වගන්තිය ආරක්ෂා කරනුයේ සාමකාමීව රැස්වීමේ අයිතිය පමණි.එය සහභාගිවන්නන්ට ප්‍රචණ්ඩ චේතනාවන් ඇති අවස්ථාවන් ආවරණය නොකරයි.චේතනාන්විතවම පොලිස් මුර වළල්ල බිඳ හෙළීමට කටයුතු කිරීම14(1)(ආ) වගන්තිය මගින් ආරක්ෂා කර ඇති සාමකාමී රැස්වීම යන සංකල්පයෙන් බැහැර වන බව සැලකිය යුතුය.

1.12. විරෝධතාකරුවන් විසින් භාවිතා කරනු ලබන ඇතැම් අන්තර්ගතයන් හෝ පණිවිඩ සඳහා, රැස්වීමට සහභාගි නොවන අය විසින් දැඩි ප්‍රතිචාරයක් ඇති කළ හැකි බැවින් රැස්වීමක් සාමකාමී නොවන බව එමගින් අදහස් නොවේ.

## 2. සියලු පෙළපාළින් සාමකාමී බවට පූර්වානුමානය කරයි

2.1.ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම හෝ උසිගැන්වීමේ චේතනාව පිළිබඳ ඒත්තු ගැන්වෙන සාක්ෂි නොමැති අවස්ථාවක විරෝධතාවයේ සංවිධායකයින්ගේ සහ සහභාගිවන්නන්ගේ සාමකාමී චේතනාව උපකල්පනය කළ යුතුය.

2.2.විරෝධතාව සාමකාමී විරෝධතාවයක් වූ විට, එය නීති උල්ලංඝණය කළ අවස්ථා වලදී වුවද පොලිසිය ඉවසීමෙන් යුතුව ක්‍රියා කල යුතුය.

2.3.නීති විරෝධී ක්‍රියාවන් නැවැත්වීම සඳහා නීති ප්‍රකාරව නියෝගයක් සිදු කල විට එවැනි නියෝගයකට අනුකූල වීම සඳහා විරෝධතාකරුවන් ප්‍රතික්ෂේප කළ අවස්තාවකදී විරෝධතාකරුවන් පොලිස් ස්ථානයට රැගෙන යාමට නීත්‍යානුකූල හේතු තිබිය හැකි බව පිළිගැනේ.ඒ කෙසේ වුවත්,විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමට සහ විරෝධතාව අවසන් කිරීමට සාධාරණීය හේතු තිබිය යුතුය.

2.4.හැකියාවක් පවතින්නේ නම් පමණක්, රැස්වීමට පෙර හෝ ඒ අතරතුර සිදු වූ නීති විරෝධී ක්‍රියාවන් සඳහා රැස්වීම අවසන් වන තෙක් රැස්වීමට සහභාගිවන්නන් අත්අඩංගුවට ගැනීම ප්‍රමාද කිරීම වඩාත් සුදුසු විය හැකිය.

2.5.නීතිවිරෝධී ක්‍රියාවලට සෘජුවම සම්බන්ධ පුද්ගලයන් පමණක් අත්අඩංගුවට ගැනීම සඳහා ඉලක්ක කළ යුතු අතර, රඳවා තබා ගැනීමට හේතු සාධක නැති වූ වහාම එවැනි පුද්ගලයන් නිදහස් කළ යුතුය.

2.6.සහභාගිවන්නන් කෙටි කාලයක් වුවද රඳවා තබා ගැනීම ඔවුන්ගේ එක්රැස් වීමේ අයිතියට සහ ඔවුන්ගේ ගමන් කිරීමේ නිදහසට සෘජුවම බලපාන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඌ) වගන්තිය යටතේ ගමන් කිරීමේ නිදහස අහිමි කිරීමක් විය හැකිය.

## IV. නීති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරින් විසින් සාමකාමීව එක්රැස්වීමට ඇති අයිතියට එරෙහිව ක්‍රියාත්මක කල හැකි අවසරලත් සීමාව

1. ඒකරාශී වීමක් විසුරුවා හැරිය හැක්කේ සුවිශේෂී අවස්ථාවන්හිදී පමණි.විරෝධතාව තවදුරටත් සාමකාමී නොවන්නේ නම් විසුරුවා හැරීමට යොමු විය හැකිය, ඉලක්කගත අත්අඩංගුවට (targeted arrests) ගැනීම් වැනි වඩා සමානුපාතික පියවර මගින් සාධාරණ ලෙස ආමන්ත්‍රණය කළ නොහැකි බරපතල ප්‍රචණ්ඩත්වයක් සඳහා ආසන්න තර්ජනයක් පිළිබඳ පැහැදිලි සාක්ෂි තිබේ නම් විසුරුවා හැරීමට යොමු විය හැකි අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කර ඇති මූලික අයිතිවාසිකම්වලට අනුකූලව විසුරුවා හැරීම සඳහා වන කොන්දේසි පොලිස් නියෝග සහ අත්පොත්වල දක්වා තිබිය යුතුය.

2. සාමකාමී විරෝධතාවක් විසුරුවා හැරීමට නියෝග කළ හැක්කේ නිසි බලයලත් නිලධාරියෙකුට පමණි.''අවශ්‍යතාවය'' සහ ''සමානුපාතිකත්වය'' යන මූලධර්මයන්හි මඟ පෙන්වීම මත අවසාන විසඳුමක් ලෙස විසුරුවා හැරීමේ තීරණය ගත යුතුය.එය නිසි බලධාරියෙකු විසින් නියෝග කළ යුත්තේ විරෝධතා දැක්වීමේ අයිතිය අභිබවමින් ප්‍රචණ්ඩත්වයන් ඇතිවීමේ දැඩි අවධානමක් ඇති වුවහොත් පමණි.

3. විරෝධතා සඳහා පෙර දැනුම් දීමේ අවශ්‍යතා වලට අනුකූල නොවීම මත හෝ වෙනත් නීත්‍යානුකූලව දක්වා ඇති පූර්ව සීමාවන්ට අනුකූල වීමට අපොහොසත් වීම හේතුවෙන් කිසි විටෙකත් විසුරුවා හැරීම සඳහා නියෝග නිකුත් නොකළ යුතුය.

4. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ප්‍රායෝගිකව හැකි තාක් දුරට, විරෝධතාකරුවන් හට විසුරුවා හැරීමට ලබා දෙන ඕනෑම නියෝගයක් සන්නිවේදනය

කර පැහැදිලි කළ යුතුය.බලය භාවිත කර විරෝධතාකරුවන් විසුරුවා හැරීමට පෙර ඔවුනට විසිරී යාමට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුය.

5. සාමකාමීව පවත්වා ගෙන යනු ලබන නමුත් මහජනතාවට බාධා පමුණුවමින් මාර්ගය අවහිර කරනු ලබන රැස්වීමක් විසුරුවා හැරිය හැකි වනුයේ කැළඹීම උග්‍ර සහ නොනවත්වා පවත්වා ගෙන යනු ලබනවා නම් පමණි.

6. ගෘහස්ත නීති වලට අනුකූලව විසුරුවා හැරීමේ නියෝගයක් ක්‍රියාත්මක කරන විට, ඒ සඳහා අවශ්‍ය වන්නාවූ බලය භාවිතා කළ හැකිය.හැකිතාක් ප්‍රචණ්ඩත්වයේ යෙදෙන පුද්ගලයන්ට එරෙහිව පමණක් අවශ්‍ය බලය යෙදවීමට පොලිසිය උත්සාහ කළ යුතුය.රැස්වීමක් විසුරුවා හැරීම සඳහා කිසි විටෙකත් ගිනි අවි භාවිතා නොකළ යුතුය.මරණීය තර්ජනයක් හෝ දරුණු හිංසනයන් ඇතිවීමේ අවධානමක් ඇති විටෙක, ගිනි අවි භාවිතා කිරීම දැඩි ලෙස අවශ්‍ය වන්නාවූ තත්වයක් උත්ගත වී ඇත්නම් ඉලක්ක කරගත් පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව බලධාරීන්ට ඇත.බලය භාවිතා කරන බලධාරීන් බලය භාවිතා කරනු ලබන සෑම අවස්ථාවක් සඳහාම වග කිව යුතුය.

7. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් බලය හෝ ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම සඳහා තීරණය කර ඇති අවස්ථාවක, තුවාල ලැබූවන්ට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රමාණවත් වෛද්‍ය පහසුකම් ඇති බව බලධාරීන් සහතික කළ යුතුය.

8. ජන රාශියක් මෙහෙය වීමේදී වග විභාගයකින් තොරව වෙඩි තැබීම සහ සම්පූර්ණ ස්වයංක්‍රීය ගිනි අවි භාවිතය නීති විරෝධී වේ.

## I කොටස: රාජ්‍ය සතු බැඳීයාවන්

**"The freedom of individuals verbally to oppose or challenge police action without thereby risking arrest is one of the principal characteristics by which we distinguish a free nation from a police state. Ideally, officers would not encounter verbal abuse. Communities would encourage mutual respect, and the police would likewise exhibit respect by treating people with dignity. But, particularly where officers engage in unconstitutional policing, they only exacerbate community opposition by quelling speech."**

**(Supreme court U.S in City of Houston, Texas v Hill, 482 U.S. 451 (1987))**

### I. පොදු බැඳීයාවන්

1. මානව හිමිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ මූලික වගකීම රජය සතු වන අතර සාමකාමී විරෝධතාවන් හීද එකී වගකීම රාජ්‍ය සතුවේ.සාමකාමීව රැස්වීමේ, ප්‍රකාශනයේ සහ ඇසුරේ නිදහස ක්‍රියාත්මක කිරීමේ ජාතික රාමුව ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුකූල බව සහතික කිරීම රාජ්‍යයේ වගකීමකි.

2. විරෝධතාව සාමකාමීව පවතින තාක්, විරෝධතාවේ අරමුණු සහ අභිප්‍රායන් හට බලධාරීන් එකඟ වුවත් නොවුවත් ඒ සඳහා පහසුකම් සැලසිය යුතුය. එවැනි සාමකාමී විරෝධතාවයක් විසුරුවා හැරීම ඇතුළුව යම් මැදිහත්වීමකට ලක් කරන්නේ නම් එකී මැදිහත් වීම් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්හි නියම කර ඇති "අවශ්‍යතාවය" සහ "සමානුපාතිකත්වය" යන නියමයන් හමුවේ දැඩි පරීක්ෂණයකට ලක් කිරීමෙන් අනතුරුව සිදු කල යුතුය.

3. වින්දිතයින්ට අධිකරණ ප්‍රතිකර්ම හෝ ජාතික මානව හිමිකම් ආයතන ඇතුළු ඵලදායී පිළියම් සඳහා ඉක්මන් ප්‍රවේශය ලබා දීමට රජය සහතික විය යුතුය.තවද, ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ උල්ලංඝණය කිරීමක් තහවුරු වී ඇත්නම්, එහි නිර්දේශය බලාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව බලධාරීන් සාධාරණ කාලයක් ඇතුළත කොමිසමට දැනුම් දිය යුතුය.

4. සාමකාමී විරෝධතාවයකට සීමා පැනවීමට රජයට බලය ඇත.කෙසේ වෙතත්, සීමාවන් සාධාරණීකරණය කිරීමේ භාරය බලධාරීන් මත වන අතර සීමාවන්හි "නීත්‍යානුකූලභාවය" සහ "සමානුපාතිකත්වය" යන නියමයන් ද්විත්වයෙහි අවශ්‍යතා සපුරාලන බව බලධාරීන් ඔප්පු කළ යුතුය.ජාතික ආරක්ෂාව පදනමක් ලෙස ගෙන එවැනි සීමා කිරීම් පැනවීමට හැකි අතර එකී සීමාවන් මගින් රාජ්‍යයට ජාතියේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකියාව ඇති වන පරිදිත්, විශ්වසනීය තර්ජනයකට හෝ බලය භාවිතා කිරීමකට එරෙහිව භෞමික අඛණ්ඩතාව හෝ දේශපාලන ස්වාධීනත්වය ආරක්ෂා කිරීමටද හැකියාව පැවතිය යුතුය.නමුත් මානව හිමිකම් යටපත් වීම නිසා පරිහානියක් සිදුවන අවස්තාවක ඉහත හේතූන් මත සීමා කිරීම සාධාරණීකරණය කළ

නොහැක.ඕනෑම සීමාවකට නීතිමය පදනමක් තිබිය යුතු අතර එය ''නීතිය මගින් නියම කරන ලද'' සහ එහි අන්තර්ගතය "ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අවශ්‍යතාවය " සඳහා විය යුතුය.

5. සීමා කිරීම් අවසර ලත් සීමාවන් සේ හඳුනාගැනීම ගැනීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්හි සඳහන් බැදියාවන් ඇතුළුව ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් සහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.එනම්,

5.1 සීමාවන් **"නීතියෙන් පනවා ඇති සීමාවන්"** විය යුතුය.සීමාවන් නීතිය හෝ නීතිය මත පදනම් වූ පරිපාලන තීරණ මත පනවා ඇති සීමාවන් විය යුතු වන අතර එකී නෛතිකව දක්වා ඇති සීමාවන් ක්‍රියාවෙහි යෙදවීමේදී එකී ක්‍රියාවන් නීතිය උල්ලංඝණය කරන්නේද යන්න පුරෝකථනය කිරීමට සහ උල්ලංඝනය කිරීමේ ප්‍රතිවිපාක තක්සේරු කිරීමට ඕනෑම පුද්ගලයෙකුට හැකි වන පරිදි ප්‍රමාණවත් නිරවද්‍යතාවයකින් යුතුව සකස් කළ යුතුය

5.2 **නීත්‍යානුකූල අරමුණක් කරා ගමන් කිරීම -** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා සීමාවන් අවශ්‍ය වේ. පනවන ලද සීමා කිරීම් තුල ''සැබෑ අවශ්‍යතාවක්'' සහ ''නීත්‍යානුකූල අරමුණක්'' ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවක් රජයට ඇති බව ප්‍රදර්ශනය කල යුතුය,ඒ මන්ද යත්, එසේ සීමා පැනවිය හැක්කේ ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය, අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස හෝ මහජන ආරක්ෂාව යන කරුණු මත පදනම්ව නිසාවෙනි.මෙහිදී ජාතික, දේශපාලන හෝ රාජ්‍ය අවශ්‍යතා ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට සමාන නොවේ.

5.3 **නීත්‍යානුකූල අරමුණට "අවශ්‍ය" සහ 'සමානුපාතික" වේ -** විරෝධතා දැක්වීමේ අයිතියට සීමා කිරීම් අවශ්‍ය යැයි සැලකිය යුත්තේ සීමාව සඳහා දැඩි සමාජ අවශ්‍යතාවයක් තිබේ නම් පමණි.සීමාවන් ක්‍රියාවට නංවන පාර්ශවය විසින් විරෝධතාවයෙහි සහ ආරක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලබන කාරණයෙහි සෘජු හා ක්ෂණික සම්බන්ධයක් පවතින බව පෙන්විය යුතුය

6. ජාතික ආරක්ෂාව සහ මහජන සාමය ආරක්ෂා කිරීමේ පදනම මත සාමකාමී රැස්වීමකට සීමා පැනවීමේදී එකී කාරණා අවධානමේ හෙළන්නාවූ තර්ජනයේ නිශ්චිත ස්වභාවය සහ අවදානම් ඔප්පු කිරීමට රජය බැඳී සිටී.සීමා පැනවීම සඳහා රටේ සාමාන්‍ය ආරක්ෂක තත්ත්වය ගැන සඳහන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ.

7. විශේෂිත ගොඩනැගිලි සහ වීදි වැනි ඇතැම් ප්‍රදේශවලට සාමකාමී විරෝධතාකරුවන් එක්රැස් වීම රජය විසින් සීමා කළ හැකි බව පිළිගෙන ඇතත්, එවැනි සීමා කිරීම් නීතියට අනුකූල විය යුතුය."කාලය, ස්ථානය සහ ආකාරය" පිළිබඳ සීමාවන් 'අවශ්‍යතාවය" සහ "සමානුපාතිකත්වය" පිළිබඳ පරීක්ෂණයන් සපුරාලිය යුතුය.යම් නගරයක සියලුම රැස්වීම් තහනම් කිරීම සාමාන්‍ය රීතියක් ලෙස යුක්ති සහගත නොවේ.

8. සාමකාමී විරෝධතාවයක් සඳහා පූර්ව අවසරයක් ලබා ගෙන තිබීමේ අවශ්‍යතාවය එවැනි අවසරයක් නොමැති විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමට අවසර දීමක් නොවන අතර එකී පූර්ව දැනුම්දීමේ ක්‍රියා පටිපාටියේ පදනම වන්නේ 14 වැනි වගන්තිය යටතේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීමට සහ මහජන සාමය සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමට රාජ්‍ය බලධාරීන්ට ඉඩ ප්‍රස්තාව සලසා දීමයි.

9. සාමකාමී රැස්වීම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය සතු වගකීමට, එවැනි රැස්වීම් කඩාකප්පල් කිරීම හෝ විසුරුවා හැරීම අරමුණු කරගත් ප්‍රකෝප කරන්නන් සහ ප්‍රති-පෙළපාලිකරුවන් වැනි පුද්ගලයින්ගෙන් සහභාගිවන්නන් ආරක්ෂා කිරීමද ඇතුළත් වේ.එවැනි පුද්ගලයින්ගේ ගොන්නට රාජ්‍ය යාන්ත්‍රණයට අයත් හෝ ඒ වෙනුවෙන් වැඩ කරන අයවලුන්ද ඇතුළත් වේ.ප්‍රති-උද්ඝෝෂණකරුවන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 5 වැනි වගන්තිය යටතේ සලකා බැලීමට හැකියාව පවතින නමුත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 21 වැනි වගන්තියේ ලබා දී ඇති ආරක්ෂාව ඔවුන්ට අදාළ නොවේ.

10. “නීත්‍යානුකූල” භාවයේ මූලධර්මයට අනුව බලය භාවිතා කිරීමේදී, විශේෂයෙන්ම මාරාන්තික බලය භාවිතා කිරීමේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිර්මාණය කරන ලද දේශීය නීතිමය රාමුවක් රජය විසින් සකසා තිබීම අවශ්‍ය වේ.ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ උද්ඝෝෂණ මෙහෙයවීමේ ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූල වන දේශීය නීති ද රජය සතුව තිබිය යුතු අතර විරෝධතා වලදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් එවැනි නීතිවලට අනුකූල වන බවට සහතික විය යුතුය.දේශීය නීති මගින් විරෝධතාවක් විසුරුවා හැරීමේදී නිලධාරීන් හට අසීමිත බලතල මෙන්ම අවශ්‍ය සියලු බලය යොදා ගැනීමට, විශේෂයෙන්ම ‘දණහිසට පහළින් වෙඩි තැබීමට’ බලතල ලබා නොදිය යුතු අතර එකී ගෘහස්තව පනවා ඇති නීති අනවශ්‍ය, අධික හෝ වෙනස් කොට සැලකීමේ පදනමක් මත විරෝධතාකරුවන්ට එරෙහිව බලාත්මක කිරීමට ඉඩ නොදිය යුතුය.

11. සියලුම අත් අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම් සහ නඩු විභාග නෛතිකව ස්ථාපිත කර ඇති නීති හා ක්‍රියා පටිපාටින්ට අනුව සිදු කළ යුතු බවට සහතික විය යුතුය.එකී ක්‍රියාවලීන් අත්තනෝමතික භාවයෙන් නිදහස් විය යුතු අතර, නීති සහ එහි යෙදුම් යෝග්‍ය මෙන්ම යුක්තිසහගත, පුරෝකථනය කළ හැකි සහ නීතිඥයෙකු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඇතුළුව නීතියේ නියමිත ක්‍රියාවලියට අනුකූල විය යුතුය.

12. සමූහ අත්අඩංගුවට ගැනීම් හෝ රඳවා තබා ගැනීම වැළැක්විය යුතුය.නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ප්‍රතිපත්තිමය වශයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ නිරතුරුවම අත්තනෝමතික ලෙස සහ නිර්දෝෂීභාවය පිළිබඳ උපකල්පනයට පටහැනි සේ සලකනු ලබන සමූහ අත්අඩංගුවට ගැනීම් වැළක්විය යුතුය.

13. විකාශනය, මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය, අන්තර්ජාලය සහ වෙනත් සන්නිවේදන වේදිකා හරහා විරෝධතා පිළිබඳ තොරතුරු බෙදා හැරීම නියාමනය හෝ සීමා කරන ක්‍රියාමාර්ග රජය විසින් පැනවීමෙන් වැළකිය යුතුය.ජාතික ආරක්‍ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය, මහජන සදාචාරය සහ ආරක්‍ෂාව සඳහා වන ඕනෑම සීමාවක් නීති ප්‍රකාරව නියම කර තිබිය යුතුය.

14. ජාතියේ පැවැත්මට තර්ජනයක් වන මහජන හදිසි අවස්ථා වලදී පමණක් ජාත්‍යන්තර මානව හිමිකම් කෙරෙහි ඇති අවනතභාවය පසෙක ළා කටයුතු කිරීමට රාජ්‍යයට අවසර ඇත.එවැනි ආකාරයෙන් අවනතභාවය පසෙක ළා කටයුතු කිරීමක් වුවද නීත්‍යානුකූලව දක්වා ඇති ජාත්‍යන්තර හා දේශීය නීතියේ සීමාවන් තුළ ක්‍රියාත්මක විය යුතුය.හුදෙක් විරෝධතා සීමා කිරීම සඳහාම රජය හදිසි තත්වයක් ප්‍රකාශ නොකළ යුතුය.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් ගෘහස්ත නීති මගින් විශේෂ ලෙස අවසර දී ඇති අවස්තාවක හැර, සිවිල් විරෝධතා මෙහෙයවීම සඳහා හමුදා, සන්නද්ධ හමුදා යෙදවීම රජය විසින් තහනම් කළ යුතුය.සිවිල් බලධාරීන්ගේ ඉල්ලීම මත, සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් විරෝධතා සඳහා ඔවුන් යෙදවිය හැකිය.

15.1. ඔවුන් යෙදවිය හැක්කේ පොලිසියට සහායක් ලෙස පමණක් වන අතර පොලිසියේ අණ යටතේ තබා ඇත. (1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 95(3)වගන්තිය).

15.2. ඔවුන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ උද්ඝෝෂණ මෙහෙයවීම පිළිබඳ ප්‍රමිතීන්ට සහ බලය භාවිතය පිළිබඳ මූලධර්මවලට මෙන්ම නිර්දේශිත මාර්ගෝපදේශවල දක්වා ඇති ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූල විය යුතුය.

15.3.ඔවුන්ගේ මෙහෙයුම් ක්‍රියා පටිපාටි සම්පූර්ණයෙන්ම සටන් ප්‍රවේශයකින් (සතුරාට එරෙහිව සටන් කිරීම) නීතිය බලාත්මක කිරීමේ ප්‍රවේශයකට මාරු විය යුතුය.උපකරණ වෙනස් කිරීම සහ උපකරණ නිවැරදිව භාවිතා කිරීම මගින් බලය භාවිතා කිරීම වළක්වා ගත යුතුය.

16. විරෝධතාවක් ප්‍රචණ්ඩත්වයකින් අවසන් වුවහොත් එසේ සිදුවූයේ ප්‍රචණ්ඩත්වයේ යෙදීමට ඉඩ ඇති හෝ එසේ ප්‍රචණ්ඩත්වයේ යෙදීමට අදහස් කරන අය සමඟ සාමකාමී විරෝධතාවයට ඵලදායී ලෙස පහසුකම් සැලසීමට, ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ ගැටුම් නිරාකරණය කිරීමට රාජ්‍යය අපොහොසත් වීම හේතුවෙන් බව රජය විසින් පිළිගැනීම අත්‍යවශ්‍ය වේ.

17. නීතිය බලාත්මක කරන නිලධාරීන් විසින් බලය භාවිතා කිරීම පිළිබඳ දේශීය නීති යාන්ත්‍රනය ජාත්‍යන්තර නීතියේ නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

18. සාමකාමීව එක්රැස් වීමේ අයිතියට අසාධාරණ සීමා පැනවීමෙන් රාජ්‍යයන් වැළකී සිටිනවා පමණක් නොව එම අයිතිය ආරක්ෂා කළ යුතු බවද පිළිගත යුතුය.ඒ කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) සහ (ආ) ව්‍යවස්ථාවේ පරමාර්ථය වන්නේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය

බලධාරීන්ගේ අත්තනෝමතික ඇඟිලි ගැසීම්වලට එරෙහිව පුද්ගලයා ආරක්ෂා කිරීම සහ එම අයිතීන් ඵලදායී ලෙස භුක්ති විඳීම සඳහා අවකාශය සකසා දීමයි.

## II. මූලික අයිතිවාසිකම් හා සබැඳි බැඳීයාවන් ගෙන් නික්මීම

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය යටතේ සහතික කර ඇති වගකීම්වලින් රාජ්‍ය සතු බැදියාවන් පසෙක ලා ප්‍රතික්ෂේප කර රාජ්‍යයට ක්‍රියා කල හැක්කේ අවස්තානුකූලව හදිසි තත්වයක් පවතින අවස්ථාවකදී පමණි.හදිසි තත්වය අවසන් වූ විට බලතල ඉවත් කළ යුතුය.විශේෂයෙන්ම, අර්බුදය හෝ හදිසි අවස්ථාව සැබෑ හෝ උත්සන්න අවස්ථාවක තිබිය යුතු අතර එය මුළු ජනගහනයටම අහිතකර ලෙස බලපාන අවස්තාවක් මෙන්ම ජනතාවගේ සංවිධානාත්මක ජීවිතයට තර්ජනයක් ඇතිකරවන අකාරයේ තත්වයක් විය යුතුය.

2. සාමාන්‍යයෙන් හදිසි බලතල ක්ෂණික හා හදිසි අර්බුදයකට අනුගත විය හැකි අකාරයෙන් නිර්මාණය කර තිබිය යුතුය.එකී බලතල නීත්‍යානුකූලව යමක් කෙරෙහි තම නොඑකගතාවය දැක්වීමට අති හැකියාව, විරෝධය පෑම්, ප්‍රකාශනය සහ සාමාන්‍ය ජන ජීවිතය සීමා කිරීමට භාවිතා නොකළ යුතුය.පවතින වතාවරණයේ හදිසි තත්වය පිළිබඳව මහජනතාව දැනුවත් විය යුතුය.

3. රැස්වීමක් තහනම් කිරීමට රජයට අයිතියක් ඇතත්, එය විකල්පයක් නොමැතිම වූ අවස්තාවක අවසාන තුරුම්පුව ලෙස භාවිතා කල යුතු පියවරක් විය යුතුය.එවැනි විකල්පයක් සඳහා යොමු විය යුත්තේ බලධාරීන් විසින් අනුගත කරගන්නා ලද සීමා සහිතව කරන ලද ප්‍රතිචාරයක් හේතුවෙන් අන් අයගේ අයිතිවාසිකම්, නිදහස සහ මහජන සාමය සුරක්ෂා කිරීමේ ප්‍රයත්නයන් ව්‍යර්ථ වූ විට දී ය.රැස්වීමක් තහනම් කිරීම හෝ තහනම් කිරීම සඳහා තීරණයන්ට එළඹිය යුත්තේ එක් එක් සිද්ධින්හි කරුණු කරණා මත පිහිටාය.සෑම රැස්වීමක්ම "නීත්‍යානුකූලභාවය", "අවශ්‍යතාවය" සහ "සමානුපාතිකත්වය" යන පරීක්ෂණ රාමුව භාවිතයෙන් තක්සේරු කළ යුතුය.

4. විරෝධතාවක් සඳහා පැනවූ තහනමක් යුක්තිසහගත බව සනාථ කිරීම සඳහා, රාජ්‍යය ප්‍රථමයෙන් රැස්වීම සඳහා පහසුකම් සැලසූ බව හෝ බැරෑරුම් අඩු සීමා පැනවීමට උත්සාහ කළ බව සාක්ෂි සැපයිය යුතුය.නිදසුනක් වශයෙන්, සාමකාමී රැස්වීමක් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් නොමැති බවට රජය තර්ක කරන විට, තහනම් කිරීම රාජ්‍යයේ සතු බැදියාවන් සහ වගකීම් ධනාත්මකව ඉටු කිරීමට අපොහොසත් වීමක් නියෝජනය කරන බව වටහා ගත යුතුය.

5. රාජ්‍යය සියලු රැස්වීම් සඳහා **පොදුවේ තහනමක්** පැනවිය යුතු නැත.අවස්තානුකූලව කාලෝචිතව පැවැත්විය යුතු රැස්වීම් සියල්ල පොදු තහනමකට යටත් කිරීම,රැස්වීම් පැවැත්වීමට සුදුසු විශේෂිත ස්ථානවල හෝ පොදු ස්ථාන වල රැස්වීම් සිදු කිරීම වලකාලීම ,රැස්වීමේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කරන අධික සීමා කිරීම් ලෙස සැලකිය යුතුය.රැස්වීම් සඳහා පොදු තහනම් පැනවීම තුලින් එම රැස්වීම් සඳහා සහභාගි වන අපේක්ෂිත ජනකායට ඇසීමට සහ දැකීමට හැකි වන පරිදි රැස්වීම් පැවැත්වීමේ හැකියාවට සැලකිය යුතු බාධා එල්ල වනු ලැබේ.

ත්‍රස්තවාදයට සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදයට එරෙහිව සටන් කිරීමේ පදනම මත සීමාවන්ට අවසර දිය හැකිය.ඒ කෙසේ වුවත්, ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය මැඩපැවැත්වීම සඳහා නිර්මාණය කර ඇති දේශීය නීති මගින් මූලික අයිතිවාසිකම් සහ නිදහස, විශේෂයෙන්ම සාමකාමීව රැස්වීමේ නිදහසට ඇති අයිතිය සම්බන්ධයෙන් කිසිදු සීමාවක් පැනවිය යුතු නැත.ඒ මන්ද යත්, ජාතික ආරක්ෂාව සහ අනෙකුත් අයගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව සඳහා මෙමගින් කිසිදු දැඩි බලපෑමක් එල්ල නොකරන හෙයිනි.

## III. සීමාවන් පැනවීමෙහි ලා ඇති සාධන භාරය (Burden of Proof)

1. රැස්වීම් සඳහා පූර්ව සීමා පැනවීම සහතික කිරීමට හුදු සැක, බිය හෝ උපකල්පන ප්‍රමාණවත් නොවේ.එමෙන්ම, රැස්වීමක් තහනම් කිරීම සාධාරණීකරණය කිරීමට පෙළපාලියක් අතරතුර ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර ඇතිවනු ලබන ඝට්ටනයන් සහ උණුසුම් තර්ක පමණක්ද ප්‍රමාණවත් නොවේ.

2. විරෝධතාකරුවන්ගේ ප්‍රචණ්ඩ චේතනාවන් ඔප්පු කිරීමේ භාරය බලධාරීන් සතුය.

3. සීමා කිරීම් සඳහා හේතු දැක්වීම් හැකි ඉක්මනින් රැස්වීම් සංවිධායකයින් හට ලිඛිතව දැනුම් දිය යුතුය.එකී සීමාවන් නීතිය ඉදිරියේ අභියෝගයට ලක් කිරීම සඳහා රැස්වීම් සංවිධායකයින් හට කල්තියා සීමාවන් පිළිබඳ දැනුම් දී තිබිය යුතුය.

## IV. එක්රැස්වීමට ඇති අයිතිය සීමා කල හැකි ආකාර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශනයේ සහ රැස්වීමේ නිදහස සීමා කිරීම සාධනීය කළ හැකි නීත්‍යානුකූල අරමුණු කිහිපයක් ලැයිස්තුගත කර ඇත.

1. **ජාතික ආරක්ෂාව** - මෙය බාහිර හෝ අභ්‍යන්තර මූලාශ්‍රයක් මගින් රටේ පැවැත්ම හෝ භෞමික අඛණ්ඩතාව කෙරෙහි එල්ල විය හැකි තර්ජනයක් හෝ බලය භාවිතා කිරීමකට එරෙහිව පදනම් කරගත් සීමාවක් වේ.ඒ කෙසේ වුවත්,දේශපාලන කථනයන් හෝ මහජන මතය ප්‍රකාශ කිරීම සඳහා සීමාවක් නොතිබිය හැකිය.ප්‍රකාශිත අදහස් ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදුකිරීම සාධාරණීකරණය කිරීමක් නොකරන්නේ නම්, භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම, ජාතික ආරක්ෂාව සහ මහජන සාමය පවත්වාගෙන යාමේ පදනම මත 15(7) වගන්තිය මත වුවද, එවැනි අදහස් පිළිබඳව සාමාන්‍ය ජනතාවට දැනුම් දීමේ අයිතිය රජය විසින් සීමා නොකළ යුතුය.බලධාරීන් හට ප්‍රචණ්ඩකාරී අදහස් ඇති නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් විසින් ප්‍රචණ්ඩත්වයට ආවඩනු ලබන ආකාරයෙන් ගායනා කරනු ලබන සටන් පාඨ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ ව්‍යාකූලත්වයන් වැලැක්වීම සඳහා නීත්‍යානුකූල අරමුණු අනුගත කර ගත හැකිය.

2. **මහජන ආරක්ෂාව** -මෙය පුද්ගලයන්ගේ ජීවිතයට, ශාරීරික අඛණ්ඩතාවට හෝ ඔවුන්ගේ දේපළවලට බරපතළ හානි නිශ්චිත ලෙසම ගෙන දෙන්නෙ නම් පමණක් රැස්වීමේ සහ ඇසුරේ නිදහස සඳහා ඇති අයිතිය සීමා කළ හැකිය.

3. **මහජන සාමය** - මහජන විරෝධතාවයම සමාජයේ ක්‍රියාකාරීත්වයට බරපතල තර්ජනයක් . ඒ කෙසේ වුවත් වෙනස් මුහුණුවරකින් ක්‍රියාත්මක වන සාමකාමී විරෝධතාවක් විසුරුවා හැරීමට මෙය අවසර නොදෙන අතර විරෝධතාවය වඩා බරපතල ලෙස සහ දැඩි මාර්ග තදබදයක් වැනි අපහසුතාවයක් හෝ බාධාවක් ඇති කරමින් නොනවත්වා පවත්වා ගෙන යන්නේ නම් පමණක් විසුරුවා හැරීමේ අවකාශය ඇත.

4. **අපරාධ වැළැක්වීම**

5. **සෞඛ්‍ය කෙරෙහි විය හැකි බරපතල තර්ජන ආරක්ෂා කිරීම** - රෝග හෝ තුවාල පැතිරීම හෝ ඇතිවීම වැළැක්වීම.

6. **අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම** - ඒකරාශී වීම් අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අරමුණින් සංවිධානය නොවිය යුතුය.මෙය රැස්වීමට සහභාගී නොවන පුද්ගලයින්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් සහතික කර ඇති මානව හිමිකම් ආරක්ෂා කිරීම හා සම්බන්ධ විය හැකිය.ඒ අතරම, ඒකරාශී වීම් යනු පොදු ස්ථානයන් සහ අනෙකුත් ස්ථානයන් නීත්‍යානුකූලව භාවිතා කිරීමකි.මෙවැනි ඒකරාශී වීම් සාමාන්‍ය ජන ජීවිතයට අනිවාර්යයෙන්ම බාධා එල්ල කළ හැකි බැවින්, අසමානුපාතික බලපෑමක් එල්ල කරන්නේ නම් මිස එවැනි බාධා කිරීම්වලට ඉඩ දිය යුතුය. මෙවැනි අවස්ථාවන්හිදී යම් සීමාවන් පනවන්නේ නම් එකී පනවනු ලබන සීමාවන් සඳහා සවිස්තරාත්මක සාධාරණීකරණයක් සැපයීමට බලධාරීන්ට හැකි විය යුතුය.

   නිදසුනක් වශයෙන්, නීතිපති කාර්යාලය ඉදිරිපිට හෝ අධිකරණ සංකීර්ණය ඉදිරිපිට අසභ්‍ය මූර්ති සහිත එකී කාර්යාලයේ දූෂණය සහ දේශපාලන පාලනය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා විරෝධතාකරුවන් පෙළපාලි යාම සදාචාර විරෝධී හා ප්‍රහාරාත්මක ලෙස සලකනු ලබන නමුත් එය නීත්‍යානුකූල අරමුණ කරා යාමේ විෂය පථයට අයත් විය හැක.

7. **ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම/ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අවශ්‍යතා** - එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, දේශපාලන බහුවිධතාවය සහ මානව හිමිකම් මත පදනම් වූ සමාජයක ඕනෑම සීමාවක් "අවශ්‍ය" සහ "සමානුපාතික" විය යුතුය.සීමා කිරීම් හුදෙක් සාධාරණ හෝ යෝග්‍ය වීම පමණක් ප්‍රමාණවත් නොවේ.අදාළ පියවරයන් ක්‍රියාවට නංවනු ලබන පියවර අතර අවම ආක්‍රමණශීලත්වයක් සතු, අදාළ ආරක්ෂිත කාර්ය සාක්ෂාත් කරනු ලබන පියවරයන් විය යුතුය.එබැවින්, නීති ප්‍රකාරව සිදු කරන පෙළපාලි වලදී

ගායනා කරන දේශපාලන සටන් පාඨ, සීමාවන් පැනවීම සඳහා අවශ්‍යතාවය හගවන්නාවූ ප්‍රචණ්ඩත්වය හෝ කැරැල්ලක් සඳහා කැඳවීමක් ලෙස අර්ථ දැක්විය නොහැක.

## V. සීමාවන් වර්ගීකරණය

1. රැස්වීමක් සඳහා පනවා ඇති සීමාවන්, ප්‍රතිපත්තිමය වශයෙන්, එහි කාලය, ස්ථානය සහ ආකාරය සම්බන්ධ විය යුතු මිස එහිදී සන්නිවේදනය කරන පණිවිඩය සම්බන්ධයෙන් නොවිය යුතුය.

### 1. ඒකරාශී වන ස්ථානය

1.1.සීමා කිරීම් සමානුපාතික ලෙස නියාමනය කිරීමකට, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට ලක් කල හැක්කේ පොදු ස්ථාන වැනි තැන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙනි. එනම්; පුළුවන් හැකි අවස්තාවලදී සුදුසු විකල්ප ස්ථාන ලබා දුනහොත් හැර ප්‍රධාන මාර්ග හෝ අත්‍යවශ්‍ය පහසුකම් වැනි පොදු අවකාශයන් අල්ලා ගැනීම සම්බන්ධයෙනි.

1.2.පහත සඳහන් ප්‍රදේශ සීමා කිරීමට හෝ තහනම් කිරීමට හැකිය;

1.2.1. භයානක නිෂ්පාදන පහසුකම් සපයන ස්ථාන හෝ වෙනත් විශේෂ තාක්ෂණික ආරක්ෂණ රෙගුලාසි වලට අයත් ස්ථාන අසල.

1.2.2. ගුවන් පාලම්, දුම්රිය මාර්ග අසල, තෙල්, ගෑස් හෝ පෙට්‍රෝලියම් නල මාර්ග හෝ අධි වෝල්ටීයතා විදුලි රැහැන් මත.

1.3.පොදු වැඩ සටහන් තහනම් කර ඇති ස්ථාන ලැයිස්තුව ව්‍යවස්ථාදායකය මගින් කලාප වශයෙන් සීමා මායිම් බෙදා වෙන් කර තිබිය යුතුය.

1.4.කෙසේ වුවත්, විශේෂ අවස්ථාවන්හිදී රැස්වීම් තහනම් කිරීම ඇතුළුව පොදු තහනම් කිරීම් අසමානුපාතික වේ. ඒ මන්ද යත් එකී තහනම් කිරීම් යෝජිත රැස්වීම්හි වාතාවරණයන් වෙන් වෙන් වශයෙන් සලකා බැලීම වළක්වන බැවිනි.

1.5.රැස්වීමේ නිදහසට ඇති අයිතියේ හරය වන්නේ සහභාගිවන්නෙකුට තම ප්‍රේක්ෂකයන්ට තම පණිවිඩය වඩාත් හොඳින් සන්නිවේදනය කළ හැකි ස්ථානය තෝරාගැනීමේ හැකියාවයි.බලධාරීන් විසින් මහජනයාට සාමකාමී රැස්වීම් සඳහා උචිත සහ විවෘත යැයි හැගෙන ස්ථාන නිශ්චිතවම බැහැර කර ඇත්නම් එය අසමානුපාතික වනු ඇත.එක් එක් සිද්ධියේ වාතාවරණයන් අනුව එවැනි ඒකරාශී වීම් සඳහා සුදුසු ස්ථාන අඛණ්ඩව තක්සේරු කළ යුතුය.පණිවිඩයක් වෙනත් ස්ථානයක ප්‍රකාශ කිරීමට හැකි වුවත්

එම අනෙක් ස්ථානය ඉලක්කගත ප්‍රේක්ෂකයන්ගේ ඇසීම සහ දැකීම සඳහා පහසුකම් සැලසුවද එම රැස්වීම වෙනත් ස්ථානයක පැවැත්වීම අවශ්‍ය කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ.

1.6.ඒ කෙසේ වෙතත්, විශේෂිත කාරණයකට අදාළ සියලු සාධක සැලකිල්ලට ගනිමින්, ඒකරාශී වීමේ ස්ථානය වෙනස් කිරීම අවශ්‍ය වන බවට බලධාරීන් සාධාරණ නිගමනයකට එළඹෙන්නේ නම් ඒ සඳහා සුදුසු විකල්ප ස්ථානයක් ලබා දිය යුතුය.ඕනෑම විකල්ප ස්ථානයක් වුවත් එකී ඒකරාශී වීම මගින් ලබා දීමට උත්සාහ කරන පණිවිඩය එය යොමු කරන අයවලුන් හට වඩා ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව පැවතිය යුතුය.තවත් අකාරයකින් කිවහොත්, ඒකරාශී වීම ඉලක්කගත ප්‍රේක්ෂකයන් හට ඇසීමට සහ දැකීමට හැකි මානයේ සිදු විය යුතුය.

1.7.විරෝධතා සංවිධායකයින්ට ඔවුන්ගේ පණිවිඩය ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට හැකි විය යුතුය.එබැවින් තෝරාගත් ප්‍රදේශය තුළ පහසුකම් සැපයිය යුතුය.උදාහරණ වශයෙන් ජාතික ආරක්ෂාව , මහජන සාමය , හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම වැනි හේතූන් මත මිස විරෝධතා සීමා කිරීම සඳහා සාධාරණීකරණය කළ හැකි බලවත් හේතු නොමැති නම් පොලිසිය විසින් යෝජනා කරනු ලැබූ විකල්ප ස්ථානය ඒකරාශී වීම සඳහා මූලික යෝජිත ස්ථානය අසලම පැවතියත් එසේ යෝජනා කිරීමක් මෙහි සඳහන් බලවත් හේතු මත මිස යෝජනා නොකළ යුතුය.ඒ කෙසේ වුවත් විකල්ප ස්ථානයක් අවශ්‍ය වන්නේ නම්, මූලික යෝජිත ස්ථානයට හැකිතාක් සමීප විකල්ප ස්ථානයක් සැපයිය යුතුය.

1.8.මෙහි සැලකිය යුතු කාරණාවක් වනුයේ විරෝධතාකරුවන් හට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනත් ආකාරයකින් හෝ වෙනත් ස්ථානයකදී ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැකි නම් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ සීමා කිරීමක් මෙහිදී සිදු නොවීමයි.ඒ අනුව, එවැනි වාතාවරණයක් තුල පොලිසිය විසින් සංවිධායකයින්, ඔවුන් ඒ වන විටත් අන්‍යයන්ගේ ආරක්ෂාව සහ නිදහස පදනම් කොට ගෙන රැස්වීම සිදු කිරීමට තීරණය කර ඇති ස්ථානයේ විරෝධතාවයට ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම නීති විරෝධී ක්‍රියාවක් නොවිය හැක.

## 2. විරෝධතාවයේ අන්තර්ගතය

2.1.කථනය සහ අනෙකුත් ප්‍රකාශන ආකාර ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තිය යටතේ ආරක්ෂාව භුක්ති විඳියි.එබැවින්,ඔවුන් සන්නිවේදනය කිරීමට උත්සාහ කරන පණිවිඩයේ අන්තර්ගතය හේතු කොට ගෙන සීමා පැනවීම නොකළ යුතුය.

2.2.රාජ්‍ය ප්‍රතිපත්ති හෝ රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාකලාපය විවේචනය කිරීම කිසිවිටෙකත් සාමකාමී රැස්වීමක් සීමා කිරීම සඳහා ප්‍රමාණවත් හේතු සාධකයක් නොවිය යුතුය.මෙය රාජ්‍යය හෝ ඕනෑම ජන කොට්ඨාශයක් හට සිත් රිදවීම්, කම්පනයන් හෝ බාධා කිරීම් වන ආකාරයේ අදහස් ප්‍රකාශ කිරීම් කරනු ලබන රැස්වීම් සඳහා ද අදාළ වේ.දේශනවල සහ පෙළපාලිවල රටේ භෞමික වෙනස්කම් ඇති කිරීම සඳහා ඉල්ලා සිටීම රටේ භෞමික අඛණ්ඩතාවයට සහ ජාතික ආරක්ෂාවට ස්වයංක්‍රීය තර්ජනයක් එල්ල නොකරයි.

2.3.නීතියේ ආධිපත්‍යය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී සහ පවතින සමාජ ක්‍රමය පිළිබඳ අභියෝග කරන දේශපාලන අදහස් පවතින සමාජයක, ඒකරාශී වීම මගින් සහ නීත්‍යානුකූල මාර්ගයෙන් එකී අදහස් සාක්ෂාත් කර ගැනීම සඳහා සධාරණ අවස්තාවක් තිබිය යුතුය.

### 3. විරෝධතාවයකදී ලාංඡන සහ අනෙකුත් වස්තූන් සංකේතාත්මකව සංදර්ශන කිරීම

3.1.කොඩි, ලාංඡන සහ වෙනත් ප්‍රකාශිත අයිතම ප්‍රදර්ශනය කිරීම ආරක්ෂිත සන්නිවේදන ක්‍රමයකි.

3.2.ලාංඡන, නිල ඇඳුම්, ඇඳුම් පැළඳුම්, කොඩි, බැනර් හෝ වස්තූන් (ඉටිපන්දම්) කම්පන සහගත ඉතිහාසයක් අනුස්මරණය කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම රැස්වීමේ නිදහස සඳහා බාධා කිරීමට හේතුවක් නොවිය යුතුය.නමුත් එවැනි සංදර්ශන නීතියෙන් තහනම් නම් කර ඇත්නම් රැස්වීම සහ සාමකාමීව පවතී නම් එකී රැස්වීම කරගෙන යාමට ඉඩ දෙන අතරතුර නිලධාරීන් පළමුව තහනම් භාණ්ඩ රාජසන්තක කිරීමට උත්සාහ කළ යුතුය.නමුත් මෙය ප්‍රචණ්ඩත්වයට,ජාතිවාදී ප්‍රකාශන, හෝ ආගමික සංහිඳියාවට තර්ජනයක් වන පරිදි ආන්දෝලනයකට තුඩු දෙන්නේ නම් එවැනි ප්‍රචණ්ඩත්වය ඇතිවීම හෝ නැවත ඇතිවීම වැළක්වීම සඳහා රැස්වීම සීමා කළ හැකිය.

## VI. බලය භාවිතය (Use of Force)

1. බලය භාවිතා කරනු ලබන්නේ සුවිශේෂී පදනමක් මත පමණි, බලය භාවිතා කිරීමේ අභිප්‍රාය පැහැදිලිව නිවේදනය කිරීමෙන් පසුව සහභාගිවන්නන්ට ප්‍රදේශයෙන් පිටවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී එකී ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුයි.

2. බලය භාවිතා කිරීම සඳහා වූ මූලධර්ම:

2.1 නීති විරෝධී රැස්වීමක් විසුරුවා හරින විට බලය යෙදිය යුත්තේ අවශ්‍ය අවම ප්‍රමාණයට පමණි. "සීමා කිරීම", "සමානුපාතිකත්වය", "හානිය අවම කිරීම" සහ "ජීවිතය ආරක්ෂා කිරීම" යන මූලධර්ම අනුගමනය කරමින් එම ක්‍රියාවලිය සිදු කල යුතුය.

2.2 නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් බලය යෙදවිය යුත්තේ සුවිශේෂී පදනමක් මත පමණි.පැමිණ සිටින පුද්ගලයින්ට ඕනෑම පොලිස් අණකට අවනත වී ප්‍රදේශයෙන් පිටවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී පැහැදිලි අනතුරු ඇඟවීමක් නිකුත් කරමින් අනතුරුව බලය යෙදවිය යුතුය.

2.3 රැස්වීමක් විසුරුවා හැරීම සඳහා බලය භාවිතා කිරීමට පෙර අවම වශයෙන් අනතුරු ඇඟවීම් තුනක් වත් ලබා දීම නිර්දේශ කෙරේ.

## VII. උද්ඝෝෂණයන්ට පෙර කරනු ලබන දැන්වීම්

### 1. මූලකාරණය

1.1දැනුම් දීමේ අවශ්‍යතාවයේ මූලකාරණය වන්නේ බලධාරීන්ට ව්‍යවස්ථාපිත පවතින පුද්ගල අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීමට සහ ආරක්ෂා කිරීම මෙන්ම විරෝධතාකරුවන් සහ අනෙකුත් ජනතාව ආරක්ෂිත සහ ඒ බව සහතික කරමින් අවශ්‍ය පියවර ගැනීමට අවස්ථාව සලසා දීමයි.

1.2දැනුම් දීමක් යනු උද්ඝෝෂණ කිරීමට ඇති ව්‍යවස්ථාපිත අයිතිය උල්ලංඝනය කිරීමක් නොවේ.නමුත් අවසරය හෝ අවසර දීමේ ක්‍රියා එසේ වෙයි.

1.3දැනුම් දීම් සාමාන්‍ය ජන ජීවිතය ,මාර්ග තදබද, හෝ වෙනත් ආරක්ෂක පියවර සඳහා වන බාධා අවම කිරීමට ප්‍රයෝජනවත් වේ.පූර්ව දැනුම්දීම් මගින් පොලිසිය හට වෙනත් අවශ්‍යතා සඳහා පෙර සැලසුම් සකස් කල හැකිය. උදා:රථවාහන සංවිධානය කිරීම වැනි දෑ. දැනුම්දීමේ අවශ්‍යතාවය හුදෙක් ක්‍රියාවලියක් අනුගමනය කිරීම සඳහාම සීමාවූ (de facto) ක්‍රියා පටිපාටියක් නොවිය යුතුය.

### 2. පවතින නීතිමය විධිවිධාන

2.1. 1984 අංක 41 දරණ පනත මගින් සංශෝධිත 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 77(1) වගන්තිය ප්‍රකාරව විරෝධතා ස්ථානය ළඟම ඇති පොලිස් ස්ථානය භාර නිලධාරියා දැනුවත් කරමින් විරෝධතාවයට අවම වශයෙන් පැය හයකට පෙර ලිඛිතව දැනුම් දීම ප්‍රමාණවත් වේ.

2.2.1984 අංක 41 දරණ පනත මගින් සංශෝධිත 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 77(3) වගන්තිය ප්‍රකාරව සහකාර පොලිස් අධිකාරී තනතුරට නොඅඩු නිලධාරියෙකුට, මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු යැයි සලකන විටෙක විරෝධතාව තහනම් කිරීමට බලය ලබා දේ.

2.3. 1984 අංක 41 දරණ පනත මගින් සංශෝධිත 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 77(3) වගන්තිය සඳහා අර්ථ විවරණ ශ්‍රී ලංකාවේ අධිකරණ නඩු විභාග මගින් සපයා ඇත.ශ්‍රේෂ්ඨාධිකරණය සරණපාල එදිරිව සෝලංග ආරච්චි, ජ්‍යෙෂ්ඨපොලිස් අධිකාරී සහ වෙනත් අය [1999] 2 SLR 166 නමැති නඩු තීන්දුව මගින් ප්‍රකාශ කර සිටියේ 77(3) වගන්තිය මගින් දක්වා ඇති බලය භාවිතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් වන බවයි.මහජන සාමය පවත්වා ගෙන යාම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග නිදහස් ප්‍රකාශනය මර්ධනය සමග සම්බන්ධයක් නොමැති විය යුතු අතර නිදහස්ව අදහස් ප්‍රකාශ කිරීමේ අභ්‍යාසය අනුෂංගිකව සීමා කිරීම සඳහා ඇති අවශ්‍යතාවය මහජන සාමය ඉදිරියට ගෙන යාම සඳහා ඇති වැදගත්භාවයට වඩා සුවිශේෂ නොවිය යුතුය. උපරිමාධිකරණය පුරා දශක ගණනාවක් මුළුල්ලේ මෙම විධිවිධාන ප්‍රනාන්දු එදිරිව නීතිපති සහ වෙනත් අය [983] I SLR 374, ගුණාර්ධන එදිරිව පෙරේරා සහ

වෙනත් අය [1983] I SLR 305, අමරතුංග එදිරිව සිරිමල් සහ තවත් අය (ජන ඝෝෂා නඩුව) [1993] 1 SLR සහ සේනසිංහ එදිරිව කරුණාතිලක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, නුගේගොඩ [2003] 1 SLR lT2 යන නඩු විභාග මගින් අඛණ්ඩව අර්ථකථනය කර ඇත.සුනිලා අබේසේකර එදිරිව ආරිය රුබසිංහ, නිසි බලධාරියා සහ වෙනත්, S.C. අයදුම්පත් අංක 1001 SLR 316 හිදී විනිසුරු අමරසිංහ මෙසේ ප්‍රකාශ කර සිටියි;

*"Exceptions to Article 14(1)(a) must be narrowly and strictly construed for the reason that the freedom of speech constitutes one of the essential foundations of a democratic society, which, as we have seen, the Constitution in no uncertain terms, declares Sri Lanka to be"*

### 3. බලය පැනවීම/ සීමාවන් හට අවසර ලබාදීම සඳහා වූ අවශ්‍යතා

3.1.අවසර ලබා ගැනීමේ අවශ්‍යතාවය ක්‍රියානුරූපිව ගත් කල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ආ) වගන්තිය යටතේ ලබා දී ඇති අයිතියට මැදිහත් වීමක් වන අතර ඒ අනුව එවැනි ඕනෑම අවශ්‍යතාවයක්;

3.1.1. නීතියෙන් නියම කළ යුතුය
3.1.2. නීත්‍යානුකූල අරමුණක් අනුගමනය කල යුතුය
3.1.3. සමානුපාතික විය යුතුය

3.2 පූර්ව අවසරයක් නොමැතිවීම සහ විරෝධතාවයේ 'නීති විරෝධී' භාවය බලධාරීන් හට සීමා පැනවීම සඳහා ධානාත්මක සංඥවක් ලබා නොදෙන අතර ඔවුන්ගේ ක්‍රියා පටිපාටිය ‘‘සමානුපාතික රීතිය’’ යටතේ සීමාවට ලක්වේ.මේ අනුව, මහජන යහපත අවදානමේ ඇති බවත් උද්ඝෝෂණය මගින් කුමන අවදානම් නියෝජනය කළේද යන්න වග දක්වමිනුත් මෙම උද්ඝෝෂණයට අවසර නොදීම සඳහා හේතු බලධාරීහු පළමු කොට තහවුරු කළ යුතුය.පෙළපාළිය විසුරුවා හැරීමේදී දක්වන ලද මැදිහත්වීමේ සමානුපාතිකත්වය තක්සේරු කිරීම සඳහා විරෝධතාකරුවන් අධෛර්යමත් කිරීමට පොලිසිය භාවිතා කරන ක්‍රමය, නිශ්චිත ස්ථානයක ඔවුන් රඳවා තැබීම සහ පෙළපාළිය විසුරුවා හැරීම යන සාධක සැලකිල්ලට ගැනේ.

## VIII. අවදානම් සහිත සහ විශේෂ කාණ්ඩයන්ට අයත් පුද්ගලයන් කෙරෙහි සැලකිය යුතු අකාරය

1. ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් අපරානුමත කර එම හිමිකම් හැකි අයුරින් බලානුගත කරමින් ගෘහස්ත නීති තුලට එකී මානව හිමිකම් නීතිගත කර සාමකාමීව රැස්වීමේ අයිතිය සුරක්ෂා කිරීම සඳහා රාජ්‍ය සතුව බැදියාවන් පවතින බව සිහිපත් කර සිටිය යුතු අතර අවධානමට ලක්විය හැකි කණ්ඩායම් සහ විශේෂ කාණ්ඩයන්ට අයත් පුද්ගලයන් තම අයිතිවාසිකම් භුක්ති විදීමේදී මුහුණ දෙන විශේෂ අවශ්‍යතා සහ අභියෝග පිළිබඳවද රාජ්‍යය ආමන්ත්‍රණය කළ යුතුය.

2. අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ කණ්ඩායම්වලට කාන්තාවන්, ළමයින්, වැඩිහිටියන්, LGBTQI ප්‍රජාව (සමරිසි, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවිය, අන්තර්ලිංගික ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව) සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුලත් වන අතර විශේෂ කාණ්ඩවලට අයත් පුද්ගලයන්ගේ ගණයට මාධ්‍ය, පූජ්‍ය පක්ෂය සහ නරඹන්නන් අයත් වේ.

3. මෙම රාජකාරියට මෙකී පුද්ගලයින්ගේ රැස්වීමේ අයිතිය සහ නිදහස භුක්ති විදීමට පහසුකම් සැලසීම සඳහා අමතර ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විය හැකි.

4. රැස්වීමක් හා සම්බන්ධ අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට රජය "ශුන්‍ය ඉවසීමේ ප්‍රවේශයක්" (zero tolerance) පෙන්විය යුතුය. සියලු උල්ලංඝනයන් නිසි ලෙස විමර්ශනය කිරීම, වැරදිකරුවන්ට නඩු පැවරීම සහ වින්දිතයින් සඳහා ඵලදායී පිළියම් සහතික කිරීම සිදු විය යුතුය.

5. ඔවුන්ගේ ඒකරාශී වීමේ අයිතිය භාවිතා කිරීමේදී නීතිය බලාත්මක කරන නිලධාරීන් විසින් මෙම කාණ්ඩවලට සැලකිය යුතු ආකාරය පිළිබඳ නිශ්චිත නිර්දේශිත මාර්ගෝපදේශ II (V) කොටසෙහි අඩංගු වේ.

## II කොටස: සිවිල් විරෝධතා සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවලදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට අදාළ නිර්දේශිත මාර්ගෝපදේශ

### I. නීති ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් පිරිස් පාලනය කිරීම

1. නීතිය ක්‍රියාත්මක කරන ආයතන මගින් සිදු කරන ජනරාශි පාලනය සියලු පුරවැසියන්ගේ සාමකාමී හැසිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා නීත්‍යානුකූල පෙළපාලි සම්බන්ධයෙන් බලධාරීන් සුදුසු පියවර ගත යුතුය. පොලිසිය ප්‍රමාණවත් පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවිය යුතු අතර, එම ස්ථානයේ සැලසුමකට අනුව ස්ථානගත කිරීමට සහ ඔවුන්ගේ රාජකාරි පිළිබඳව මනාව දැනුවත් විය යුතු වේ.

2. පුද්ගලයෙකුට මාරාන්තික බලයක් භාවිතා කරන විට නීතිය ක්‍රියාත්මක කරන යාන්ත්‍රණය වෙත අපරාධ චෝදනා එල්ල කල හැකිය.

3. ශ්‍රී ලංකාවේ, ජනරාශි විසුරුවා හැරීමේ රාජකාරි ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ: පොලිසිය විසින් ජනරාශි විසුරුවා හැරීමේ රාජකාරි සහ හමුදාව විසින් ජනරාශි විසුරුවා හැරීමේ රාජකාරි. පොලිසිය විසින් ජනරාශි විසුරුවා හැරීමේ රාජකාරි පොලිස් නියෝග වල සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අඩංගු වේ.

4. හමුදාව අවම බලයේ මූලධර්මය අනුගමනය කළ යුතු අතර, විරෝධතාවකදී නීත්‍යානුකූල කටයුත්තක් සඳහා අවශ්‍ය වූ විට පොලිසිය විසින් අවශ්‍ය වන්නාවූ බලය යෙදවිය යුතුය. බලය භාවිතා කරන විට මෙම සීමාව සැමවිටම යෙදිය යුතුය.

5. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඌ) වගන්තිය යටතේ මහජනතාවගේ නිදහසේ ගමන් කිරීමට පහසුකම් සැලසීම සඳහා පෙළපාලිකරුවන් විසින් ප්‍රධාන මාර්ගයේ ඉදිකර ඇති මාර්ග බාධකයක් ඉවත් කිරීමට පොලිසිය මැදිහත් වීම යුක්ති සහගත ය.

6. කඳුළු ගෑස් සහ ජල ප්‍රහාරක වැනි මාරාන්තික බවින් අඩු පුළුල් ප්‍රදේශ වලට පැතිර යන ආයුධ, නිර්විශේෂ බලපෑම් ඇති කරයි; එවැනි ආයුධ භාවිතා කරන විට, තෙරපීම හෝ අවට සිටින අයට හානි කිරීම වැනි අවදානම් සීමා කිරීමට සියලු සාධාරණ උත්සාහයන් ගත යුතුය.

6.1. බැටන් ප්‍රහාර, ජල ප්‍රහාරක සහ අනෙකුත් ප්‍රබල ජනරාශි පාලනය කිරීමේ ක්‍රම භාවිතය දැඩි ලෙස නියාමනය කළ යුතු අතර කඳුළු ගෑස් කෑන් කීයක් මුදා හැර තිබේද යන්න වැනි තොරතුරු සටහන් කළ යුතුය.
6.2. කඳුළු ගෑස් ප්‍රහාර කිසිවිටෙක පුද්ගලයෙකුට ඍජුව හෝ විරුද්ධව එල්ල නොකළ යුතුය.

6.3 කඳුළු ගෑස් හෝ ජල ප්‍රහාර භාවිතා කළ යුත්තේ විසුරුවා හැරීම සඳහා පමණක් වන අතර කිසිවිටෙකත් අනුකූලතාව සුරක්ෂිත කිරීමට නොවේ.

6.4 භූගෝලීය හෝ යටිතල ව්‍යුහාත්මක බාධක හේතුවෙන් ජනතාවට (අසල රැඳී සිටින්නන්ට, සහභාගිවන්නන්ට, ප්‍රචණ්ඩකාරී සහ සාමකාමී යන දෙඅංශයෙන්ම) එම ස්ථානයෙන් පිටව යා නොහැකි ස්ථානවල කිසිවිටෙක කඳුළු ගෑස් හෝ ජල ප්‍රහාර භාවිතා නොකළ යුතුය.

6.5 ඉහත සඳහන් කළ දේ භාවිතා කළ යුත්තේ වාචික අනතුරු ඇඟවීමකින් පසුව විරෝධතාකරුවන්ට විසිර යාමට ප්‍රමාණවත් ඉඩ අවකාශයක් ලබා දීමෙන් පසුව පමණි

7. බැටන් පොලු, කඳුළු ගෑස්, වෙනත් රසායනික ද්‍රව්‍ය සහ ජල ප්‍රහාරවලින් සිදුවන විශාල හානිය සැලකිල්ලට ගෙන, ඒවා භාවිතා කල යුත්තේ ඉහළම මට්ටමේ අණදෙන නිලධාරියකුගේ තීරණයකට අනුව සහ ඒවා නිසි ලෙස භාවිත කිරීම පිළිබඳ පුළුල් පූර්ව පුහුණුවක් ලැබූ පොලිස් නිලධාරීන් විසින් පමණි.

8. විරෝධතාවක් ප්‍රචණ්ඩත්වයට පත්වන අවස්ථාවන්හිදී පවා, නීතිය ක්‍රියාත්මක කරන නිලදාරීන් විරෝධතාකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කළ යුතුය, එනම් අත්අඩංගුවට පත්වූ අවස්ථාවක් මත ජීවත්වීමේ අයිතිය සහ නිදහස, රඳවා තබා ගැනීම සහ වධහිංසා වලට භාජනය නොකිරීම.

9. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් බලය  භාවිතා කිරීම  පිළිබඳ විනිවිද වාර්තාවක් වහා ලේඛනගත කළ යුතුය. තුවාලයක් සිදු වූ විට, බලය භාවිතා කිරීමට තුඩු දුන් හේතුව ඇතුළුව  බලය යෙදවීම අවශ්‍යද සහ සමානුපාතිකද යන්න තහවුරු කිරීමට  ප්‍රමාණවත් විස්තර අඩංගු විය යුතුය.

10. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්  විරෝධතා භූමියෙන් පලා යන විරෝධතාකරුවන් ශාරීරිකව ලුහුබැඳ නොයා යුතුය.

11. බලය  භාවිතා කිරීමේ ඕනෑම අවශ්‍යතාවයක්  පහව ගිය පසු, එනම් ප්‍රචණ්ඩකාරී පුද්ගලයෙකු ආරක්ෂිතව අත්අඩංගුවට ගත් විට වැනි වෙනත් කිසිදු බලයක් භාවිතා කිරීමට අවසර නැත. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විරෝධතාවක් විසුරුවා හැරීම, අපරාධයක් වැලැක්වීම හෝ අත්අඩංගුවට ගැනීමක් ක්‍රියාත්මක කිරීමේ නීත්‍යානුකූල අරමුණට සමානුපාතිකව වඩා විශාල බලයක් භාවිතා නොකළ හැකිය. නීත්‍යානුකූල පරමාර්ථය සාක්ෂාත් වූ පසු, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් වහාම බලය භාවිතා කිරීම අවසන් කළ යුතුය.

## II. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ රාජකාරි

1. සාමකාමී සහ සාමකාමී නොවන සහභාගිවන්නන් අතර වෙනස හඳුනා ගන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියේ දක්වා ඇති නෛතික සහතිකය අහිමි වන්නේ ප්‍රචණ්ඩත්වයට සහභාගී වන අයට පමණි. සිදු කරන ලද ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය අනුව එවැනි වෙනසක් කළ නොහැකි නම් මිස සාමාන්‍යයෙන් සියලුම සහභාගිවන්නන්ට වඩා තනි පුද්ගල වැරදි කරන්නන් ඉලක්ක කළ යුතුය.

2. විරෝධතා සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධ සැලසුම් කිරීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ විමසීම්  (වෙනස්වන තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම) යන සියලු අංශවල මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය. මේවා:

2.1 සම්බන්ධ කණ්ඩායම් පිළිබඳ දැනුම;

2.2 විරෝධතාවයට පහසුකම් සැලසීමට කැපවීම;

2.3 විරෝධතාව අතරතුර සෑම අදියරකදීම ස්වේච්ඡා සන්නිවේදනයේ වටිනාකම හඳුනා ගැනීම;

2.4 සහභාගිවන්නන්ගේ විවිධත්වය හඳුනා ගැනීමට.

3. නොවැළැක්විය හැකි නම් මිස, නීතිය ක්‍රියාත්මක කරන ආයතන කිසි විටෙකත් විරෝධතා වලදී බලය යෙදිය යුතු නැත. බලය භාවිතා කරන්නේ නම්, එය සීමා කිරීම, සමානුපාතිකත්වය, හානිය අවම කිරීම සහ ජීවිතය ආරක්ෂා කිරීම යන මූලධර්ම අනුගමනය කරමින් අවශ්‍ය අවම ප්‍රමාණයට යෙදිය යුතුය. මාරාන්තික විය හැකි ආයුධ ලෙස, ගිනි අවි පොලිසිය හෝ විරෝධතා විසුරුවා හැරීම සඳහා සුදුසු උපායික මෙවලම් නොවන අතර ඒවා භාවිතය වළක්වා ගත යුතුය. විරෝධතාවකදී බලය භාවිතා කරන්නේ නම්, එය ස්වයංක්‍රීය හා කඩිනම් සමාලෝචනයක් ආරම්භ කළ යුතුය.

4. බලය යෙදවීමෙන් තුවාල හෝ මරණ සිදු වූ විට, ස්වාධීන, විවෘත, කඩිනම් සහ ඵලදායි පරීක්ෂණයක්, එම කාර්යය සඳහා පත් කරන ලද සහ අවංක සහ නිපුණතාවය ඇති පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කළ යුතුය. වගකිව යුතු නිලධාරීන් සුදුසු පරිදි දණ්ඩනයට භාජනය කළ යුතු අතර, ප්‍රතිකර්ම පිළිබඳව වින්දිතයන් දැනුවත් කළ යුතුය.

5. මැදිහත්වීම මගින් අනෙකුත් අනෙකුත් නිලධාරීන් අධික බලය යෙදවීම වැළැක්විය හැකි අවස්ථාවලදී මැදිහත් වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ද වගකිව යුතුය. විරෝධතා සංවිධායකයින්ගේ ප්‍රචණ්ඩ චේතනාවන් ඔප්පු කිරීමේ භාරය බලධාරීන් සතුය.

6. තම අණ යටතේ සිටින නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් නීතිවිරෝධී ලෙස බලය සහ ගිනි අවි භාවිත කල බවට හෝ නීතිවිරෝධී ලෙස බලය සහ  අවි භාවිතයට ඉඩ ඇති  බව උසස් නිලධාරීන් දැන සිටියේ නම් හෝ දැන සිටිය යුතු නම්, හෝ එවැනි සිද්ධීන් වැළැක්වීමට, මර්දනය කිරීමට හෝ වාර්තා කිරීමට ඔවුන් සියලු පියවර ගත්තේ නැති නම් උසස් නිලධාරීන් වග වීමට ලක් කරන බව රජය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහතික කළ යුතුය.

7.  පුද්ගලයෙකුගේ මරණයට හෝ දරුණු තුවාල වලට තුඩු දෙන පරිදි  ගිනි අවි භාවිතා කිරීමට උසස් නිලධාරීන් නිකුත් කල   නියෝගය පැහැදිලිවම නීති විරෝධී බව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් දැන සිටියේ නම් සහ එය පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීමට සාධාරණ අවස්ථාවක් තිබේ නම් උසස් නිලධාරීන්ගේ නියෝගවලට කීකරු වීම නිදහසට කාරණාවක් නොවේ.

8. ඉහත නීති විරෝධී නියෝගය නිකුත් කළ ප්‍රධානියා මත මූලික වගකීම පැවරිය යුතුය.

9. සමූහ අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් හැකිතාක් දුරට වැළැක්විය යුතුය.

10. රැස්වීමක් අතරතුර, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට පුද්ගල අනන්‍යතාවය තහවුරු කරන සංකේත දෘශ්‍යමාන ලෙස පැළඳීමට හෝ ප්‍රදර්ශනය කිරීමේ වගකීමක් ඇත. ඔවුන් තම නිල ඇඳුමේ හෝ හිස්වැස්මේ නාම පුවරුවක් හෝ අංකයක් වැනි යම් ආකාරයක හඳුනාගැනීමක් පැළඳිය යුතුය. එවැනි හඳුනාගැනීමේ තොරතුරු  අදාල සිද්ධිය අතරතුර ඉවත් කිරීම හෝ ආවරණය කිරීම නොකළ යුතුය.

11. , මහජන හැඟීමකින් පුද්ගලික වගවීම පිළිබඳ සංකල්පය හිස් සංකල්පයක් බවට පත් නොවන බව සහතික කිරීමට පොලිසිය විසින් සිදු කරන මැදිහත්වීම් වලදී, පොලිස් නිලධාරීන්ට සාමාන්‍යයෙන් ඔවුන්ගේ තත්ත්වය සහ පුද්ගලික අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ලබා දිය හැකියාවක් තිබිය යුතු වේ.

12. නීතිය ක්‍රියාත්මක කිරීම තුළ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ අපරාධකරුවන් හඳුනා ගැනීමට පොලිසිය සෑම උත්සාහයක්ම ගත යුතුය.

13. පොලිස් කාර්යයන් තෙවන පාර්ශවයකට පැවරිය නොහැක. පොදුවේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් රැස්වීම් සාමාන්‍යයෙන් මුර කළ යුතුය. ප්‍රචණ්ඩත්වය උත්සන්න වීම වළක්වා ගැනීම සඳහා එවැනි කාර්යයන් සඳහා පුහුණු නොකළ සන්නද්ධ හමුදා සාමාජිකයන් (හමුදා පොලිසිය ඇතුළුව) සම්බන්ධ කර නොගත යුතුය. අභ්‍යන්තර ආරක්ෂාව පොලිසියේ කාර්යයක් වන අතර ජාතික ආරක්ෂාව ත්‍රිවිධ හමුදාවේ කාර්යයක් වන අතර, එසේ වනුයේ ඔවුන් නිර්මාණය කර ඇති අරමුණු සහ ඔවුන්ගේ පුහුණුව සහ සූදානම සම්බන්ධයෙන් සලකා බලන කල පැහැදිලිවම වෙනස් ආයතන දෙකක් ලෙස සලකන බැවිනි. අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධ කටයුතුවලදී සන්නද්ධ හමුදාවන්ගේ මැදිහත්වීම් මානව හිමිකම් කඩකිරීමේ අවදානමක් ඇති බැවින් එය වළක්වා ගැනීමට උපදෙස් දෙනු ලැබේ.

14. විරෝධතා සංවිධායකයින් සඳහා ඵලදායී සන්නිවේදන මාර්ග පවතින බව බලධාරීන් විසින් සහතික කළ යුතුය.  රැස්වීම් පැවැත්වීමට පෙර නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ප්‍රමාණවත් ලෙස කටයුතු කළ යුතුය. සංවිධායකයින් විසින්  රැස්වීම පැවැත්වීමට සැලසුම් කරන ආකාරය ගැන වැඩිදුර දැන ගැනීමට කල්තියා හඳුනාගත් එවැනි ඕනෑම  රැස්වීම් සංවිධායකයෙකු බලධාරීන් විසින් සම්බන්ධ කර ගත යුතු වේ. එවැනි ක්‍රියාමාර්ග විශ්වාසය තහවුරු කර ගැනීමට සහ පසු අවස්ථාවකදී අනපේක්ෂිත සිදුවීම් ඇති නොවන බව සහතික කිරීමට උපකාරී වේ.

15. රැස්වීමට පෙර සහ අතරතුර සංවිධායකයින් සමඟ සම්බන්ධ වීමට පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් නම් කිරීම නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන්ට නිර්දේශ කෙරේ. අදාල පොලිස් සම්බන්ධතා අංශයේ අදාළ සම්බන්ධතා තොරතුරු පුළුල් ලෙස ප්‍රචාරය කළ යුතුය. එම පුද්ගලයා හෝ කණ්ඩායම සම්බන්ධතා ස්ථානයක් ලෙස ක්‍රියා කළ යුතු අතර, සංවිධායකයින්ගේ හෝ විරෝධතාකරුවන්ගේ අයිතීන් සීමා කිරීමට හෝ බලපෑම් කිරීමට සහ අවිශ්වාසයට හේතු විය හැකි බුද්ධි රැස්කිරීම් වැනි වෙනත් පොලිස් කාර්යයන් සිදු නොකළ යුතුය.

16. රැස්වීම පැවැත්වෙන වේලාව, ස්ථානය සහ ආකාරය පිළිබඳව රැස්වීමක සංවිධායකයින් සමඟ අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සෑම උත්සාහයක්ම ගත යුතුය. එවැනි සංවාදයක් සියලු පාර්ශ්වයන්ට පිළිගත හැකි විසඳුමක් ඇති බව සහතික කිරීම සඳහා සමථ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම උපකාරී වේ.

17. විරෝධතාකරුවන් විරෝධතාව අනවසර ප්‍රදේශයක නොපවත්වන ලෙසට පොලිසිය විසින් නිකුත් කල නියෝග පිළිපැදීම ප්‍රතික්ෂේප කරන නමුත් ප්‍රචණ්ඩ ක්‍රියාවල නොයෙදෙන අවස්ථාවකදී, පොලිස් නිලධාරීන්ගේ බලහත්කාරී මැදිහත්වීම අසමානුපාතික වන අතර කලබල වීම වැළැක්වීමට අනවශ්‍ය වේ.

18. චේතනාවෙන් සහ ක්‍රියාත්මක කිරීමේදී සාමකාමීව පවතින තාක් කල්, නිරායාසයෙන් රැස් වූ රැස්වීම් සහ කලින් දැනුම් නොදෙන රැස්වීම් ඇතුළුව, කෙටි දැනුම්දීමකින් හෝ හදිසි අවස්ථාවකට ප්‍රතිචාර වශයෙන් රැස්වන රැස්වීම් සඳහා පහසුකම් සැලසීමට බලධාරීන් සාධාරණ සහ සුදුසු පියවර ගත යුතුය. සහභාගිවන්නන්ගේ නීතිවිරෝධී හැසිරීමකින් තොරව, අවශ්‍ය පූර්ව දැනුම්දීමක් නොමැතිකම නිසා පමණක් රැස්වීම් තහනම් කිරීමට ගත් තීරණය සාමකාමීව රැස්වීමේ නිදහස අසමානුපාතික ලෙස සීමා කිරීමකි.

## III. අණ දෙන ධුරාවලිය

1. විරෝධතාවකදී, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ මෙන්ම පොලිසියේ මැදිහත්වීම අවශ්‍ය වන විරෝධතාවක් අතරතුර, ජනරාශි පාලනය කිරීම ආරක්ෂක සැලැස්මකට දැඩි ලෙස අනුකූලව සෑම විටම සිදු කළ යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම අවධාරණය කරයි.

2. නිශ්චිත සහ හඳුනාගත හැකි අණ දීමේ ධුරාවලියක් සඳහා එය ඉතා වැදගත් වේ. නීතිය ක්‍රියාත්මක කරන සංවිධානවල අණ දීමේ ධුරාවලිය යනු සංවිධානය තුළ විවිධ නිලධාරීන්ට වගකීම් පැවරීම සඳහා භාවිතා කරන ශ්‍රේණිගත ව්‍යුහයකි, එමඟින් ඔවුන් එක් ආයතනයක් ලෙස එකට වැඩ කිරීමට සහ වඩා හොඳ සම්බන්ධීකරණයකට පහසුකම් සපයයි.

3. පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව සම්බන්ධයෙන් අණදීමේ ධුරාවලිය ස්ථාපිත කර තවදුරටත් ශක්තිමත් කළ හැකි විවිධ ක්‍රම පහත දැක්වේ.

### i. පොලිසිය

අණ දෙන ධුරාවලිය නිර්ණය කිරීමට සහ පිරිස් පාලනය සඳහා අවශ්‍ය නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී උද්ඝෝෂණයන්ට අදාළ ආරක්ෂක සැලැස්ම පරම වේ. එම ආරක්ෂක සැලැස්ම පැවතෙන තත්වයන් මත එක් එක් උද්ඝෝෂණයට අනන්‍ය වේ
(ආරක්ෂක සැලැස්මක තිබෙන අණ දෙන ධුරාවලියට අදාළ නිදසුනක් ඇමුණුම 1හි දක්වා ඇත)

## 1. උද්ඝෝෂණය අතරතුර සම්බන්ධීකරණය

ජනරාශි පාලනයේ ප්‍රධාන මූලධර්මය වනුයේ අදාල තත්වය උග්‍ර වීමට පෙර සමනය කිරීමයි. එබැවින් ජනරාශි පාලනය කිරීමේදී පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව තුළ සම්බන්ධීකරණය සහතික කිරීම අවශ්‍ය වේ.

1.1. සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ පනතේ VIII සහ X පරිච්ෙඡ්දයට සහ පොලිස් විධාන A19 හි II වන කොටසට අනුකූලව ජනරාශි පාලනය සඳහා අනුයුක්ත කල සෑම පොලිස් නිලධාරියෙකුම ජනරාශි පාලනය සහ සහ එම තත්වය උග්‍ර වීම වැලැක්වීම සම්බන්ධයෙන් පුහුණුව ලබා ඇති බව සහතික කරන්න.

1.2. පුහුණු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විරෝධතාවයේ තත්ත්වය සමාලෝචනය කිරීමට සහ ඒ තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම පිණිස එම විරෝධතාව පැවැත්වෙන ස්ථානයට අනුයුක්ත කර ඇති බවට සහතික වන්න.

1.3. ජනරාශි පාලනය කිරීම සඳහා යොදවා ඇති නිලධාරීන්ට ඔවුන් අනුයුක්ත කර ඇති විරෝධතා භූමියේ භූගෝලීය සහ ජන සංයුතිය පිළිබඳව තොරතුරු හුරුපුරුදු විය යුතුය. පවතින සෑම ක්‍රමයක් තුලින්ම අණදෙන නිලධාරීන් සහ ඔවුන් යටතේ සිටින අය අතර සුමට හා කඩිනම් සන්නිවේදනයකට පහසුකම් සැලසිය යුතුය.

1.4. පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව අතර උද්ඝෝෂණය පිළිබඳ තොරතුරු සුමට හා කඩිනම් ලෙස සන්නිවේදනය විය යුතුය.

1.5.ජනාධිපති ආරක්ෂක අංශය (PSD), අගමැති ආරක්ෂක අංශය (PMSD) සහ අමාත්‍ය ආරක්ෂක අංශය (MSD) ඔවුන්ට පවරා ඇති ප්‍රදේශ ආරක්ෂා කිරීම සම්බන්දයෙන් කටයුතු කරන විට, මෙම අංශ උද්ඝෝෂණය පැවැත්වෙන ප්‍රදේශය සම්බන්ධයෙන් බලය ඇති පොලිසිය සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

## 2. විරෝධතාවය අතරතුර සහ ඉන් පසුව වගවීම

වගවීම ශක්තිමත් කිරීම සඳහා සමූහ පාලනයට අදාළ නිලධාරි වගවීම වැදගත් වේ

2.1. සියලුම පිරිස් නිල ඇඳුමින් සිටීම අවශ්‍ය වේ. නිලධාරීන්ගේ ලාංඡන, නාම පුවරු සහ වෙනත් පුද්ගලික සහ ඔවුන් නියෝජනය කරන ආයතන හඳුනාගැනීම සඳහා ඇති අනෙකුත් නිල ලාංඡන එම නිලධාරින්ගේ හිස්වැස්මේ හෝ නිල ඇඳුමේ පිටත පැහැදිලිව සෑම විටම දෘශ්‍යමාන වන අයුරින් තිබිය යුතුය.

2.2. සියලුම නිලධාරීන් අදාල ඉල්ලීමක් ලැබුණු විටදී ඔවුන්ගේ වාසගම, ලාංඡන අංකය, නිලය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයේ නම වාචිකව ලබා දිය යුතුය.

2.3. සාධාරණ සැකයකට භාජනය වී ඇති විරෝධතාකරුවෙකු විමර්ශන කටයුතු සඳහා වාර්තා කිරීමට නිලධාරියෙකුට හැකියාව ඇත.

2.4. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධිත පනතේ 95(1) වගන්තිය ප්‍රකාරව, විරෝධතා භූමියේ සිටින පොලිස් පරීක්ෂක නිලයට නොඅඩු ඉහළම අණදෙන නිලධාරියාගේ වගකීම වනුයේ ඕනෑම අවස්ථාවක උද්ඝෝෂණයේ පවතින තත්ත්වයන් හොඳින් සලකාබලා ඉන් අනතුරුව ජනරාශි පාලනයට අදාළව නියෝග ලබාදීම වේ.

2.5 කිසියම් අවස්ථාවක විරෝධතා භූමියේ සිටින අණදෙන නිලධාරියාට අකර්මන්‍ය වීම නිසා (උදා: ප්‍රහාරයට ලක්වීම) නියෝග නිකුත් කළ නොහැකි නම්, නියෝග නිකුත් කිරීමේ හැකියාව වෙනත් ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරියෙකුට පැවරිය හැක.

2.6 උද්ඝෝෂණ භූමියේ රැඳී නොසිටින ධූරාවලියේ ඉහළ මට්ටමේ සිටින අණදෙන නිලධාරියෙකු උද්ඝෝෂණයේ තත්වයන් පිළිබඳව දැනුවත් විය යුතු අතර, පිරිස් සහ උපකරණ සම්බන්ධ ඇති වන ඕනෑම අවශ්‍යතාවයක් පිළිබඳ නිරන්තරයෙන් අවධානයෙන් සිටිය යුතු අතරම ඔහුගේ අණ යටතේ සිටින උද්ඝෝෂණය පැවැත්වෙන භූමියේ රැඳෙමින් නියෝග නිකුත් කරන නිලධාරියාගේ ක්‍රියාකලාපයන්ට වගවිය යුතුයි.

2.7. කනිෂ්ඨ නිලධාරියෙකුට පැන නැගුනු ගැටලුවක් මතු කිරීමට හෝ උද්ඝෝෂණයට අදාළ නව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් (උදා. දුෂ්කරතා, වැඩි පිරිස් සහ උපකරණ අවශ්‍යතාවය), ඔහු එම ගැටලුව ජ්‍යෙෂ්ටත්වයේ ධූරාවලියේ තමාට සෘජුවම ඉහලින් සිටින නිලධාරියාට වහාම දැනුම් දිය යුතුය. අණ දෙන ධූරාවලිය නොබිඳී පවතින බව සහතික කිරීම උදෙසා මෙය දිගු ගමනක් යනු ඇත.

2.8. පොලිස් විධාන අංක A19 අනුව, පොලිසිය විසින් මේ වන විට <u>රැකවල් වාර්තාවක් (watch report)</u>, තොරතුරු පොතක් සහ නිලධාරියාගේ වාර්තාවක් පවත්වාගෙන යයි. මීට අමතරව, උද්ඝෝෂණය අතරතුර ගනු ලැබූ ක්‍රියාමාර්ග, ඒවායේ බලපෑම, යෙදවූ පිරිස් සහ උපකරණ සංඛ්‍යාව, සිදු වූ කිසියම් නිශ්චිත සිදුවීමක්, පසුවිපාක සහ අනාගතයේදී විරෝධතාවන් හි ජනරාශි පාලනය තව තවත් ක්‍රමවත් කිරීමට අදාල නිර්දේශ ඇතුලත් නමුත් ඒවාට පමණක් සීමා නොවූ සවිස්තරාත්මක තක්සේරු වාර්තා (assessment reports) ලිඛිතව පවත්වාගෙන යාම ද අවශ්‍ය වේ.

2.9. උද්ඝෝෂණයකට අදාල තක්සේරු වාර්තාව පහත පරිදි සකස් කිරීමට නිර්දේශ කෙරේ

2.9.1. කිසිදු ව්‍යතිරේකයකින් තොරව, උද්ඝෝෂණය සාමකාමී ද නීති විරෝධී ද යන්න නොසලකා, විරෝධතාව පැවති ස්ථානයේ අණදෙන නිලධාරියා සම්පූර්ණ පසු ක්‍රියාදාම වාර්තාවක් (After-Action Report (AAR)) සම්පූර්ණ කළ යුතුය.

2.9.2. තවද, කුමන හේතුවක් මත හෝ වෙඩි තැබූ ඕනෑම නිලධාරියෙකු, එහි බලපෑම කුමක් වුවත්, වෙඩි තැබූ වාර ගණන, ඉලක්කය, වෙඩි තැබීමට හේතුව, වෙඩි තැබීමට නිකුත් කරන ලද නියෝගයක් වේ නම් එම නියෝගය, නියෝගය නිකුත් කළ නිලධාරියාගේ අනන්‍යතාවය සහ විරෝධතා භූමියේ සිටි

ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ අනන්‍යතාවය යන කරුණු ඇතුළත් නමුත් ඒවාට පමණක් සීමා නොවූ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
2.9.3. භූමියේ රැඳී සිටි අණදෙන නිලධාරියා විසින් හැකි ඉක්මනින් සියලුම ලිඛිත වාර්තා අදාල සිදුවීමෙන් පසු සම්පූර්ණ කර, සිදුවීම පිළිබඳ සවිස්තර වාර්තාවක් සියලුම උසස් පොලිස් නිලධාරීන්ට ඇති බව සහතික කිරීම සඳහා ධූරාවලියේ තමාට සෘජුවම ඉහලින් සිටින සහ ධූරාවලිය හරහා පොලිස්පතිවරයාට හෝ අවම වශයෙන් අදාළ පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට භාර දිය යුතුය.

2.9.4. යම් අවස්ථාවකදී නිලධාරියෙකු විසින් වාර්තාව සහ සිදු වූ දෙය අතර යම් විෂමතාවයක් හෝ රාජකාරි කඩ කිරීමක් අනාවරණය කරගතහොත් , අදාළ නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණයක් සඳහා පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී නීතිමය පියවර ගත යුතුය.

2.10. නිලධාරීන් විසින් තම අණදෙන නිලධාරියාගේ නීත්‍යානුකූල අණකින් තොරව ධූරාවලිය කඩ කිරීම හෝ වෙනත් ආකාරයක විෂමාචාරයක් පිළිබඳ ලබන ඕනෑම චෝදනාවක් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් හරහා විමර්ශනය කළ යුතු අතර වරද කළ නිලධාරියා නීතිමය ක්‍රියාමාර්ගවලට යටත් විය යුතුය.

## ii. විශේෂ කාර්ය බළකායේ (STF) කාර්යභාරය

1. පොලිස් විශේෂ කාර්ය බළකාය පිහිටුවීමේ අරමුණ වූයේ රට තුළ ත්‍රස්ත විරෝධී සහ කැරලි මර්දන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමයි. එබැවින්, සම්පූර්ණයෙන්ම සිවිල් වැසියන්ගෙන් සමන්විත විරෝධතා ව්‍යාපාර වලදී අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිළිබඳව වැඩිදුර පුහුණුවක් විශේෂ කාර්ය බලකායට ලබා දිය යුතුය.ත්‍රස්තවාදීන් සහ කැරලිකරුවන් සඳහා නියම කර ඇති ක්‍රියාමාර්ග සාමාන්‍ය වැසියන්ට භාවිතා නොකළ යුතු වේ.

2. විශේෂ කාර්ය බලකාය අනියුක්ත කර ඇති ස්ථාන වලදී ඔවුන් හඳුනාගත හැකි වන අයුරින් නිල ඇඳුමින් සිටිය යුතුය . ඔවුන්ගේ ලාංඡන, නාම පුවරු සහ අනෙකුත් පුද්ගලික සහ ඔවුන් නියෝජනය කරන ආයතන හඳුනාගැනීම සඳහා ඇති අනෙකුත් නිල ලාංඡන සෑම විටම එක් එක් නිලධාරියාගේ හිස්වැස්ම හෝ නිල ඇඳුමෙන් පිටත දෘශ්‍යමාන විය යුතු වේ.

## iii. ත්‍රිවිධ හමුදාව

1. සිවිල් විරෝධතාවක දී ජනරාශි පාලනය කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව කැඳවූ විට, සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 95 සිට 97 දක්වා වගන්තිවලට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ.
2. 95(3) වගන්තිය යටතේ, පොලිසියට නීතිවිරෝධී ජනරාශියක් විසුරුවා හැරීමට නොහැකි වූ විට, මහේස්ත්‍රාත්වරයෙකුට, දිස්ත්‍රික්කයේ දිසාපතිවරයෙකුට හෝ පොලිස් අධිකාරී නිලයට නොඅඩු ඕනෑම පොලිස් නිලධාරියෙකුට එම ජනරාශිය විසුරුවා හැරීමට ත්‍රිවිධ හමුදාව කැඳ වීමට හැකියාව ඇත.

3. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධිත පනතේ 96 වැනි වගන්තියට අනුව ත්‍රිවිධ හමුදාවේ ඕනෑම බළලත් නිලධාරියෙකුට, මහේස්ත්‍රාත්වරයෙකු, දිස්ත්‍රික්කයේ දිසාපතිවරයෙකු හෝ පොලිස් අධිකාරී නිලයට නොඅඩු ඕනෑම පොලිස් නිලධාරියෙකු සමග සන්නිවේදනය කළ නොහැකි අවස්ථාවන්හිදී එම නිලදාරීන්ගේ ගේ උපදෙස් නොමැතිව නීති විරෝධී රැස්වීමක් විසුරුවා හැරිය හැකි බව කොමිසම අවධාරණය කරයි. එවැනි අවස්ථාවක, ත්‍රිවිධ හමුදාවේ ඕනෑම බළලත් නිලධාරියෙකුට නීති විරෝධී රැස්වීම විසුරුවා හැරීමට සහ ඒ සඳහා ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට හෝ සිරගත කිරීමට හැකිය. කෙසේ වෙතත්, මෙම පුද්ගලයින් සමඟ සන්නිවේදනය කළහැකි වූ විට, ත්‍රිවිධ හමුදාව මහේස්ත්‍රාත්වරයාගේ, දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ හෝ පොලිස් අධිකාරී නිලයට නොඅඩු ඕනෑම පොලිස් නිලධාරියෙකුගේ උපදෙස්වලට අවනත විය යුතුය. මේ අනුව, සන්නිවේදනය නැවත ස්ථාපිත කළ විටදී ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් පොලිස් අධිකාරී නිලයට නොඅඩු පොලිස් නිලධාරියාගේ උපදෙස් පිළිපදිති.

4. පහත සඳහන් අවස්ථා වලදී හැර ත්‍රිවිධ හමුදාවේ සහභාගීත්වය පොලිසියේ උපදෙස් වලට යටත් විය යුතුය.

4.1. මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව මහජන සාමය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ගත් තීරණයේ ප්‍රතිඵලයක් ලෙස හදිසි නීතිය ක්‍රියාත්මක වන විට, (එනමුදු , ජනරාශි පාලනයේදී මෙම අවස්ථාවෙහිදී පොලිසිය සමඟ සන්නිවේදනය සහ සම්බන්ධීකරණයේ දීම නිර්දේශ කරයි )

4.2. මහජන ආරක්‍ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව මහජන ආරක්‍ෂාවට තර්ජනයක් වන තත්ත්වයන් උද්ගත වී ඇතැයි හෝ එවැනි තත්වයක් ඇති වීමට අත්‍යාසන්න යැයි තමන් විශ්වාස කරන ප්‍රදේශයේ මහජන සාමය ආරක්‍ෂා කරන ලෙස ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මගින් ත්‍රිවිධ හමුදාවෙන් ඉල්ලා සිටින අවස්ථාවක.

5. සිවිල් විරෝධතා වන්හි ජනරාශි පාලනය සඳහා ත්‍රිවිධ හමුදාව සහභාගී වන විට, යම් විරෝධතාවක තත්වයන්ට ගැලපෙන පරිදි පිහිටුවන ලද සුවිශේෂී ආරක්ෂක සැලැස්මකට අනුව, ත්‍රිවිධ හමුදාව සඳහා ශක්තිමත් අණදෙන ධුරාවලියක් ස්ථාපිත කළ යුතුය. අණදීමේ ධුරාවලිය සහ යොදාගත යුතු ජනරාශි පාලනය කිරීමේ ක්‍රියාමාර්ග නිර්ණය කිරීමේදී ආරක්ෂක සැලැස්ම පරම වේ. (සිවිල් අධිකාරී වලට හමුදා සහය දීමේදී අදාල වන එවැනි අණදීමේ ධුරාවලියක් පිළිබඳ උදාහරණයක් පහත ඇමුණුම 2 හි විස්තර කර ඇත).

6. හමුදාව, නාවික සහ ගුවන් හමුදාව තුළ අණ දීමේ ධුරාවලිය ශක්තිමත් කිරීම; සහ ජනරාශි පාලනය කිරීමේදී පොලිසිය සමඟ වඩා හොඳ සම්බන්ධීකරණයකට පහසුකම් සැලසීම.

6.1. සන්නද්ධ සතුරු සටන්කාමීන්ගෙන් වෙන් කොට සිවිල් වැසියන්ට සැලකීමේ වෙනස අවධාරණය කරමින් සිවිල් විරෝධතා වලදී ජනරාශි පාලනය කිරීම සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවට දැඩි පුහුණුවක් ලබා දිය යුතුය.

6.2. තවද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධිත පනතේ 95(3) වගන්තියට අනුව, නීති විරෝධී ජනරාශි විසුරුවා හැරීමේදී සහ අවශ්‍ය පරිදි අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සිදු කිරීමේදී, තත්වය පාලනය කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය පරිදි බලය යෙදවිය යුතුය.

6.3. ත්‍රිවිධ හමුදාව සතුව පොලිසියේ අණදීමේ ධුරාවලිය දාමය සහ ත්‍රිවිධ හමුදාවේ අණදීමේ ධුරාවලිය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

6.4. ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ අණදෙන නිලධාරීන් අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයකට පහසුකම් සැලසිය යුතුය.

6.5. කනිෂ්ඨ නිලධාරියෙකුට පැන නැගුනු ගැටලුවක් මතු කිරීමට හෝ උද්ඝෝෂණයට අදාළ නව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් (උදා. දුෂ්කරතා, වැඩි පිරිස් සහ උපකරණ අවශ්‍යතාවය), ඔහු එම ගැටලුව ජ්‍යෙෂ්ටත්වයේ ධූරාවලියේ තමාට ඍජුවම ඉහලින් සිටින නිලධාරියාට වහාම දැනුම් දිය යුතුය. අණ දෙන ධුරාවලිය නොබිඳී පවතින බව සහතික කිරීම උදෙසා මෙය දිගු ගමනක් යනු ඇත.

6.6. පොලිසිය විසින් සම්පාදනය කිරීම සඳහා ඉහත නිර්දේශ කර ඇති වාර්තාවට සමාන වාර්තාවක් විරෝධතාව පැවති ස්ථානයෙ සිටි යුද, නාවික සහ ගුවන් හමුදාවේ අණදෙන නිලධාරීන් විසින් විරෝධතාවෙන් පසුව සම්පාදනය කර ඔහුගේ ඍජු ප්‍රධානියාට ඉදිරිපත් කළ යුතුය. වගවීම සහතික කිරීම පිණිස එම වාර්තාව ධූරාවලියේ ඉහළම මට්ටමට ළඟා වන බව එම ඉහල නිලධරයා විසින් සහතික කළ යුතු වේ.

6.7. නිලධාරීන් විසින් තම අණදෙන නිලධාරියාගේ නීත්‍යානුකූල අණකින් තොරව ධුරාවලිය කඩ කිරීම හෝ වෙනත් ආකාරයක විෂමාචාරයක් පිළිබඳ ලබන ඕනෑම චෝදනාවක් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් හරහා විමර්ශනය කළ යුතු අතර වරද කළ නිලධාරියා විනය/ පරිපාලන හා නීතිමය ක්‍රියාමාර්ගවලට යටත් විය යුතුය.

6.8. නීතිය හා සාමය ආරක්ෂා කිරීම පිණිස ජනරාශි පාලන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී සාර්ථක අණදීමේ ධුරාවලියක් අත්‍යවශ්‍ය බැවින්, පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ සෑම නිලධාරියෙක්ම නියත වශයෙන්ම අණදීමේ ධුරාවලිය පිළිබඳව දැනුවත්ව සිටීම අතිශයින්ම වැදගත්ය. මෙම කාරණය සම්බන්ධයෙන් කිසිදු නිදහසට කරුණක් හෝ සම්මුතින් ඇති නොකළ යුතුය.

## IV.පෙර සූදානම් වීම සහ උපායික විකල්ප

### 1. විරෝධතාවයක් සම්බන්ධ පූර්ව සූදානම

විරෝධතාවයට සම්බන්ධ සියලු දෙනාම ඇතුළුව සාමාන්‍ය ජනතාව සහ විරෝධතා භූමිය තුල සහ ඒ අවට ඇති දේපළවල ආරක්ෂාව සහතික කිරීම සඳහා විරෝධතාවකට පෙර සූදානම් වීම අත්‍යවශ්‍ය වේ. විරෝධතා භූමියේදී පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව විසින් ගත හැකි ප්‍රතිචාරවල ස්වභාවය කෙරෙහි පෙර සූදානම් වීමේ අදියර සෘජුවම බලපානු ලබන අතර එවිට ඔවුන්ට යුතු ජනරාශි නීත්‍යානුකූලව සහ ඵලදායී ලෙස විසුරුවා හැරීමට හැකි වනු ඇත.විරෝධතාවක් සඳහා පෙර සූදානම් වීමේදී වැදගත් වන පහත නිර්ණායක කොමිසම විසින් හඳුනාගෙන ඇත:

1.1. අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම
1.2. අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සහ සකස් කිරීම
1.3. පූර්ව නිශ්චිත ප්‍රතිචාර
1.4. විරෝධතා පිළිබඳ තොරතුරු රැස් කිරීම

### 2. අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම:

2.1. වෛද්‍ය සේවාවන් සමඟ සම්බන්ධීකරණය

2.1.1. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ප්‍රචණ්ඩකාරී විරෝධතාවක් ඇතිවීමට ඇති හැකියාව පිළිබඳව රෝහලට දැනුම් දීමෙන් පසු ළඟම ඇති රෝහල සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

2.1.2. ගිලන් රථ සහ පරිපූරක වෛද්‍යවරුන් වැනි වෛද්‍ය සේවාවන් වලට විරෝධතා භූමියට බාධාවකින් තොරව ප්‍රවේශ වීමට සහ ඒ අසල ස්ථානගත කර ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.
2.1.3. විරෝධතා වලදී තුවාල ලැබූ පුද්ගලයින් සඳහා (ඔවුන් නිලධාරීන් විසින් බලය භාවිතා කිරීම නිසා හෝ වෙනත් ආකාරයකින් තුවාල ලැබුවද) වෛද්‍ය ආධාර ඉල්ලා සිටීමට විරෝධතා ස්ථානයේ සිටින නිලධාරීන් බැඳී සිටී.
2.1.4. තුවාල වූ බව පෙනීයන හෝ තමන් තුවාල වූ බව පවසන පුද්ගලයින් (නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් බලය භාවිතා කිරීම හේතුකොට ගෙන නිසා හෝ වෙනත් ආකාරයකින්) සඳහා වෛද්‍ය ආධාර ලබා දීමට හෝ ඔවුන් වෙනුවෙන් වෛද්‍ය ආධාර ඉල්ලීමටමට අපොහොසත් වන නිලධාරීන්ට පොලිස් නියෝග A19 අනුව මනුෂ්‍යාත්වය නොමැති බවට යන චෝදනාවට ලක් වෙනු ඇත (පොලිස් වෙඩි තැබීමේ ප්‍රතිපලයක් ලෙස තුවාලයක් සිදු වූ විට), සහ විනය පරීක්ෂණයකට යටත් විය යුතුය.

2.2 අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම:

2.2.1. ගිනි නිවන දෙපාර්තමේන්තුව
2.2.2. ජලය, විදුලිය සහ විදුලි සංදේශ සේවා සපයන්නන්

2.2.3. බුද්ධි අංශ
2.2.4.අදාළ වෙනත් ආයතන

2.3 තොරතුරු හුවමාරු කර ගැනීම :

2.3.1 නීති විරෝධී රැස්වීම විසුරුවා හැරීම සඳහා හැකි ඉක්මනින් සහ ප්‍රායෝගිකව ප්‍රතිචාර දැක්විය හැකි බව සහතික කිරීමට;

2.3.2 විරෝධතාවයේ තත්වයන්ට ගැලපෙන පරිදි හොඳම ආරක්ෂක සැලැස්ම තීරණය කිරීම සඳහා විරෝධතාව සම්බන්ධ හා ඒ ආශ්‍රිත තොරතුරු බහුවිධ තොරතුරු මූලාශ්‍රවලින් ලබාගත යුතුය; සහ

2.3.3. මෙලෙස පොලිසිය විසින් රැස් කරන ලද තොරතුරු පොලිස් බලකාය පුරා ප්‍රචාරය කළ යුතු අතර ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිලධාරීන් සමඟ හැකිතාක් දුරට ප්‍රායෝගික අන්දමින් බෙදා ගත යුතුය.

2.3.4. විරෝධතාවයේ තත්ත්වයන්ට අනන්‍ය වූ ආරක්ෂක සැලැස්මක් සකස් කිරීම සඳහා එසේ රැස් කරන තොරතුරු විශ්ලේෂණය කිරීම තුළින් බුද්ධි තොරතුරු ඒකරාශී කළ යුතුය

## 3. අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සහ සකස් කිරීම

3.1. අයුතු ජනරාශි පාලනය කිරීමේ ක්‍රමවලට සම්බන්ධ උපකරණ, මාරාන්තික නොවන ආයුධ (උදා: ජල ප්‍රහාරක, කඳුළු ගෑස් කැනිස්ටර්) සහ මාරාන්තික අවි අයුතු ජනරාශියකදී සමූහයා පාලනය කිරීම සඳහා සූදානම් කළ යුතුය.

3.1.1 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) 'නීතිය බලාත්මක කිරීමේදී මාරාන්තික බවින් අඩු ආයුධ පිළිබඳ මාර්ගෝපදේශය' අනුව නීතිය ක්‍රියාත්මක කිරීමේදී භාවිත කරන ආයුධ නීත්‍යානුකූල ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු සපුරාලීමට සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුකූල වන පරිදි නිර්මාණය කර නිෂ්පාදනය කළ යුතුය.

3.1.2. ඒ සඳහා අවශ්‍ය නම් ආයුධ සහ උපකරණ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය බලධාරීන් විසින් ස්වාධීන පරීක්‍ෂාවට ලක් කළ යුතුය. (උදා, විශේෂයෙන් කඳුළු ගෑස්වල රසායනික සංයුතිය)

3.1.3. පොලිස් නියෝග A19, 25 අනුව, ආයුධ සහ ඒ ආශ්‍රිත උපකරණ විරෝධතා භූමියේ යෙදවීමට පෙර හොඳ තත්ත්වයේ (උදා.- කල් ඉකුත් වී නැති,) ඇති බව තීරණය කිරීම සඳහා සම්පූර්ණයෙන් පරීක්ෂා කළ යුතුය.

3.2 පහත සඳහන් දෑ ගබඩා කළ යුතු ප්‍රදේශ විරෝධතාවයේ සහ ඒ අවට ස්ථාපිත කළ යුතුය.

3.2.1. සිවිල් කැළඹීම් වලදී භාවිතා කළ යුතු සම්පූර්ණ ආම්පන්න (උදා: පලිහ, ගෑස් වෙස් මුහුණු, බැටන් පොලු, මාරාන්තික නොවන සහ මාරක අවි) සාමකාමී විරෝධතාවක් අයුතු ජනරාශියක් බවට පත් වූ විට

භාවිතා කළ යුතු වේ. , සමූහයා උසිගැන්වීමට ඉඩකඩ ඇති බැවින් මාරාන්තික ආයුධ ප්‍රදර්ශනය කිරීම හෝ භාවිතා කිරීම මෙම තත්වය ඇති වන තුරු නොකළ යුතුය.

3.2.2. ආහාර සහ ජලය සැපයීම (පානය කිරීම සඳහා සහ කඳුළු ගෑස් බලපෑම් වලින් සහනය ලැබීම සඳහා)

3.3. අවශ්‍ය අනෙකුත් උපාංග වර්ග ඇතුළත් විය යුතු අතර එය පහත සඳහන් දෑවලට සීමා නොවේ:
3.3.1. මෙගාෆෝනය
3.3.2. ආලෝක සංඥා පුවරු
(රාත්‍රියේ පැවැත්වෙන විරෝධතා වලදී භාවිතා කිරීමට)
3.3.3. නීති විරෝධී විරෝධතාකරුවන් නීත්‍යානුකූලව අත්අඩංගුවට ගැනීම සඳහා නිසි උපකරණ
3.3.4. උපස්ථ වාහන සහ අමතර ඉන්ධන
3.3.5. සන්නිවේදන උපකරණ
3.3.6. සංචරණය සීමා කිරීම සඳහා සිවිල් වැසියන් විසින් පිහිටුවා ඇති බාධක (උදා: වාහන, බැරල්) ඉවත් කිරීමට අවශ්‍ය උපකරණ

3.4. පොලිස් මාධ්‍ය කොට්ඨාශය සහ අපරාධ වාර්තා කොට්ඨාශය (Criminal Records Division-CRD) විරෝධතාවේ ප්‍රගතිය වීඩියෝ කිරීමට පුද්ගලයින් එවිය යුතු අතර සිදුවීම් අනුපිළිවෙල පිළිබඳ වාර්තාවක් පසු සමාලෝචනය සඳහා සාක්ෂි එකතු කිරීම වෙනුවෙන් ලබා දිය යුතුය.

## 4. පූර්ව නිශ්චිත ප්‍රතිචාර

4.1 සිද්ධිය අතරතුරදී සිදු වන , දේපලවලට සාපරාධී හානි සිදුකිරීම, ගිනි තැබීම්, කොල්ලකෑම්, විනාශ කිරීම්, ශාරීරික පහරදීම්, නිලධාරියෙකු හෝ ප්‍රජා සාමාජිකයෙකු ගලවා ගැනීමට අවශ්‍ය වන ගැටළු වැනි නිශ්චිත වූ අපරාධමය ක්‍රියාකාරකම් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී ඇතිවන අපරාධමය ක්‍රියාවන් සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධිත පනතට අනුකූල පූර්ව තීරණය කළ ප්‍රතිචාර/විකල්ප වැඩි දියුණු කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබේ.

4.2 සාකච්ඡා කළ හැක්කේ සභාව සාමකාමීව පවතින විට පමණි. විරෝධතාකරුවන් නීතිය කඩ කරන විට එය විකල්පයක් නොවේ.

4.3. අණදෙන නිලධාරීන් විසින් ආරක්ෂක සැලැස්මක් සකස් කළ යුතුය.

4.4. නීතිවිරෝධී ලෙස රැස්ව සිටින පිරිස් පාලනය කිරීම සඳහා මාරාන්තික නොවන සහ මාරාන්තික අවි භාවිතා කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලබා ඇති නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවකින් විරෝධතා පැවැත්වෙන ස්ථානවලට යෙදවිය යුතුය.

4.5. විරෝධතා පැවැත්වෙන ස්ථානවල සිටින විශේෂ සහ අවදානමට ලක්විය හැකි පුද්ගල කණ්ඩායම් සමඟ කටයුතු කිරීමට විධිවිධාන සැලැස්විය යුතුය.

4.6. විශේෂ විමර්ශන නිලධාරියෙක් පත් කිරීම :

4.6.1. අත්අඩංගුවට ගත් අයගේ ස්ථානයට අදාළ තොරතුරු පොලිස් ස්ථානවලදී සැපයීම; සහ

4.6.2. වධහිංසා පැමිණවීම් හෝ වෙනත් ආකාරයේ විෂමාචාරයන් පිළිබඳ පැමිණිලි කිරීමට.

එවැනි නිලධාරියෙක් සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේ සිටිය යුතු වේ. (පැමිණිලි විමර්ශනය කිරීම සහ සහන සැලසීම සඳහා ස්වාධීන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතුය).

4.7 වපසරිය තුල ආරක්ෂාව ශක්තිමත් කළ යුතුයි.

4.7.1. නිශ්චිත ස්ථානවලට ප්‍රායෝගිකව ප්‍රවේශ විය නොහැකි ලෙස මහජනතාවට අනවශ්‍ය ලෙස බාධා නොවන්නේ නම් පමණක් පොලිසිය මහජනතාව සහ දේපළ ආරක්ෂා කිරීම සඳහා සුදුසු බාධක ඇති කළ හැකිය.

4.7.2. ආරක්‍ෂාව පිළිබඳ ගැටළුවක් නොවන්නේ නම්, සිවිල් වැසියන්ට විකල්ප මාර්ග භාවිත කිරීමට සහ ඒ අනුව ගමන් සැලසුම් කිරීම සඳහා යකඩ බාධකවලින් අවහිර වී ඇති මාර්ග පිළිබඳව මාධ්‍ය ප්‍රකාශයක් කළ යුතුය.

## 5. විරෝධතා පිළිබඳ තොරතුරු රැස් කිරීම

5.1. විරෝධතාව සම්බන්ධව රැස් කරන ලද තොරතුරු ඇසුරින් පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ සම්බන්ධීකරණය අවශ්‍ය වන ජනරාශි කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක්ලබා දෙනු ඇත. විරෝධතාවයට සම්බන්ධ ප්‍රදේශවල පොලිස් බලය ඇති පොලිස් ස්ථාන සමඟ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව තීරණය කිරීම සඳහා හැකිතාක් දුරට සාකච්ඡා කළ යුතුය.

5.2. නීත්‍යානුකූල අවේක්ෂණ උපක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඉහළ පුහුණුවක් ලත් ජංගම නිලධාරීන්
5.2.1. තත්වය නිරන්තරයෙන් තක්සේරු කිරීම සහ ජනරාශියේ තත්ත්වය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම,
5.2.2. ජනරාශිය පාලනය කිරීමට අවශ්‍ය විය හැකි අමතර පිරිස් හෝ වෙනත් සම්පත් තීරණය කිරීම; හා
5.2.3. ඔවුන්ගේ සොයාගැනීම් පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිලධාරීන්ට සන්නිවේදනය කිරීම, එවිට ඔවුන් ලබා ගත හැකි නවතම තොරතුරු මත ගත හැකි සුදුසුම ක්‍රියාමාර්ගය තීරණය කිරීම,

යන කාරණා සම්බන්ධව කටයුතු කිරීමට (උදා: යතුරුපැදිවල හෝ පයින් ගමන් කරන) විරෝධතා පැවැත්වෙන ස්ථානවල ස්ථානගත කළ යුතු බව කොමිසම නිර්දේශ කරයි.

## 6. නිශ්චිත උපායික විකල්ප මත තීරණ ගැනීම

6.1.විරෝධතා භූමියකදී ගත යුතු ජනරාශි පාලනය කිරීමේ ක්‍රියාමාර්ග තීරණය කිරීමේදී පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ අණ දෙන නිලධාරීන්ට තෝරා ගැනීමට පුළුල් පරාසයක විකල්ප තිබේ.විරෝධතාවල පවත්නා ඉක්මනින් වෙනස් විය හැකි අනපේක්ෂිත ස්වභාවය නිසා, විරෝධතා භූමියේ යෙදිය යුතු ජනරාශිය පාලනය කිරීමේ පියවරයන් පිළිබඳ අනම්‍ය සැලැස්මක් සකස් කළ නොහැකි බව තේරුම් ගත

යුතු වේ. එබැවින්, තත්වයන් සහ සම්පත් සහ පිරිස් ලබා ගැනීමේ හැකියාව අනුව නම්‍යශීලී ප්‍රවේශයක් භාවිතා කරන ලෙස අණ දෙන නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබේ.

6.2. කෙසේ වෙතත්, එකම හෝ විවිධ කාලවලදී එක් උපායික විකල්පයක් හෝ බහු උපායික විකල්ප භාවිතා කිරීම තීරණය කිරීමේදී, පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු බව කොමිසම නිර්දේශ කරයි:

6.2.1. නිශ්චිත උපායික විකල්පය භාවිතා කිරීම පිටුපස ඇති අරමුණ
6.2.2. උපායික විකල්පයේ සාර්ථකත්වය මැනීමට ඇති දර්ශක
6.2.3. විශේෂිත උපායික විකල්පය භාවිතා කරන්නේ නම් (පුද්ගලයින් සහ වෙනත් සම්පත් වැනි) අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට බාධා කරන හෝ උපකාර වන සාධක
6.2.4. උපක්‍රමශීලී විකල්පය භාවිතා කිරීමේ හෝ ඉවත් කර ගැනීමේ අවදානම් තක්සේරු කිරීම (මහජන ආරක්ෂාව, දේපලවල ආරක්ෂාව සහ පොලිස් නීත්‍යානුකූලභාවය කෙරෙහි එහි ඇති බලපෑම වැනි)
6.2.5. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධිත පනත සහ මේ සම්බන්ධව පොලිසිය සහ සන්නද්ධ හමුදා.වෙත යොමු කර ඇති දැනට පවතින මාර්ගෝපදේශ ඇතුළු පවතින නීතියට අනුකූලව එම උපක්‍රමය භාවිතා කිරීමේ සාධාරණත්වය සහ අවශ්‍යතාවය.

## V. උද්ඝෝෂණයන්හිදී අවදානම් සහිත සහ විශේෂ වර්ගීකරණයන්ට අයත් පුද්ගලයන් සම්බන්ධව කටයුතු කිරීම

විරෝධතාවලට සහභාගි වන විශේෂ සහ අවදානමට ලක්විය හැකි පිරිස් සඳහා පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව විශේෂ ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුයි. (මේ සම්බන්ධයෙන් වන සාර්ව රාජ්‍ය වගකීම් සඳහා ඉහත I (VIII) කොටස බලන්න).

### i. අවදානමට ලක්විය හැකි කණ්ඩායම්

<u>පොදු කටයුතුවලට සහභාගී වීමේ අයිතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍යයන් සඳහා වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය</u> විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව, පහත දැක්වෙන කණ්ඩායම්වලට අයත් පුද්ගලයින් අවදානමට ලක්විය හැකි යැයි සැලකේ. එබැවින්, පහත සඳහන් පුද්ගලයින් ප්‍රධාන වශයෙන් ගැවසෙන ස්ථාන වලට අදාලව ජනරාශි පාලනය සඳහා කොමිෂන් සභාව පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

1. කාන්තාවන්
2. දරුවන්
3. වැඩිහිටි ප්‍රජාව
4. ආබාධ සහිත පුද්ගලයන්

**ළමුන්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන පොදු නිර්දේශ:**

**1. කාන්තාවන්**

1.1 වෙනස් කොට සැලකීම, අවමන් කිරීම හෝ අවමන් සහගත වචන භාවිතා නොකරන බවට නිලධාරීන් සහතික විය යුතුය.

1.2 කාන්තා නිලධාරිනියන් සාධාරණ ප්‍රතිශතයක් විරෝධතා පැවැත්වෙන ස්ථාන වෙත නියුක්ත කිරීමටත්, කාන්තාවන් සම්බන්ධයෙන් ජනරාශි විසුරුවා හැරීමේ උපක්‍රම භාවිතා කිරීමේදී හැකිතාක් දුරට සහ ප්‍රායෝගිකව කාන්තා නිලධාරිනියන් විසින් ඒවා සිදු කිරීමටත් නිලධාරීන් වග බලා ගත යුතුය.

1.3 විරෝධතාවක් අතරතුර කාන්තාවක් සෝදිසි කිරීමට අවශ්‍ය වූ විට, සංශෝධිත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ පනතේ 30 වැනි වගන්තිය ප්‍රකාරව, කාන්තා නිලධාරිනියක් විසින් සෝදිසි කිරීම සිදු කළ යුතුය.

**2. දරුවන්**

2. විරෝධතා වලදී ළමුන්ට ඉහළම මට්ටමේ ආරක්ෂාවක් ලබා දිය යුතු බව කොමිසම ප්‍රකාශ කරන අතර එය තීරණාත්මක වන්නේ:

2.1 දරුවන් සිටින බව දන්නා හෝ විශ්වාස කරන ප්‍රදේශවල කඳුළු ගෑස් භාවිතා නොකෙරේ. එවැනි ආයුධ භාවිතා කිරීමේ අවශ්‍යතාවය පැනනගින්නේ නම්, ජනරාශිය විසුරුවා හරින බවට  අනතුරු ඇඟවීමක් ලබා දෙන බවට සහතික වී පැමිණ සිටින ඕනෑම දරුවෙකු විසුරුවා හැරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.
2.2 දෙමාපියන්ගෙන් වෙන්වුනු දරුවන් ආරක්ෂා කිරීමට සහ ඔවුන් සමඟ ගනුදෙනු කිරීමට නිලධාරීන්ට 'මනෝවිද්‍යාත්මක පුහුණුවක්' ලබා  යුතුය.

**3. වැඩිහිටි ප්‍රජාව**

ඔවුන්ගේ ශාරීරික සීමාවන් සැලකිල්ලට ගනිමින් වැඩිහිටියන්ට ගෞරවයෙන් සැලකිය යුතුය

**4. ආබාධ සහිත පුද්ගලයින්**

4.1 තමන්ට ඇති සාමකාමීව රැස්වීමේ අයිතිය භාවිතා කරන ආබාධ සහිත පුද්ගලයින්ට ගෞරවයෙන් සැලකිය යුතුය.

4.2 ඔවුන්ට  අනන් වූ  කායික හා මානසික ලක්ෂණවලට අනුගත වීමට පියවර ගත යුතුය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් පියවර නිර්දේශ කරනු ලැබේ:

4.2.1. ආබාධ සහිත පුද්ගලයින් ද විරෝධතාවලට සහභාගී වන බවට නිලධාරීන් දැනුවත් කිරීම.

4.2.2. ආබාධිත පුද්ගලයින්ගෙන් ඔවුන්ගේ සේවා සුනඛයන්, වේවැල්, රෝද පුටු හෝ වෙනත් තාක්ෂණික ආධාරක විරෝධතා භූමියේදී හෝ පොලිස් ස්ථානයේදී වෙන් නොකළ යුතු බව හඳුනා ගන්න.

## ii. විශේෂ කණ්ඩායම්

පහත සඳහන් පුද්ගල කණ්ඩායම් වලට පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ විශේෂ ආරක්ෂාව සහ සැලකිල්ල අවශ්‍ය වේ.

1. මාධ්‍ය
2. පූජක පක්ෂය
3. අසල රැඳෙන්නන්

### 1. මාධ්‍ය

1.1 නීතියේ ආධිපත්‍යය මගින් පාලනය වන ඕනෑම රාජ්‍යයක මාධ්‍යයට ප්‍රමුඛ කාර්ය භාරයක් ඇති අතර එමගින් අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කරයි. 'මහජන නිරීක්ෂකයෙකු' ලෙස මාධ්‍යයේ කාර්යභාරය වන්නේ පොදු යහපත -එනම් මහජනතාවට දැන ගැනීමට අයිතිය ඇති තොරතුරු පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීමයි. මෙම සන්දර්භය තුළ මාධ්‍ය නියෝජිතයින්ගේ කාර්යභාරය විශේෂ වැදගත්කමක් දරයි, මන්ද ඔවුන්ගේ පැමිණීම, විරෝධතාකරුවන් පාලනය කිරීමට හෝ විසුරුවා හැරීමට හෝ මහජන සාමය ආරක්ෂා කිරීමට භාවිතා කරන ක්‍රම ඇතුළුව ඔවුන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් බලධාරීන්ට, පෙළපාලිකරුවන්ට සහ මහජනතාවට වගවිය යුතු බවට වන සහතිකයක් බැවිනි.

1.2. රැස්වීමක් පිළිබඳ මාධ්‍ය සහ අනෙකුත් වාර්තා මහජනතාවට, සංවිධායකයින්ට සහ රැස්වීමකට සහභාගිවන්නන්ට අත්‍යවශ්‍ය වේ. එබැවින්, නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට ඇති හැකියාව සාමකාමීව රැස්වීමේ නිදහසේ අයිතියේ අත්‍යවශ්‍ය අංගයකි. මාර්ගෝපදේශ සඳහා, නිරීක්ෂකයින් යනු මහජන රැස්වීම් වලට සහභාගී නොවන තුන්වන පාර්ශ්ව පුද්ගලයින් ලෙස අර්ථ දක්වා ඇති අතර ඔවුන්ගේ මූලික අරමුන වන්නේ මහජන රැස්වීම් වල ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීමයි.

1.3. විරෝධතා වලදී මාධ්‍යයේ භූමිකාව පිළිබඳ මානව හිමිකම් කමිටුවේ අංක 37 දරන සාමාන්‍ය විවරණයට කොමිසම අවධානය යොමු කරයි. එහි සඳහන් වන්නේ 'සාමකාමීව රැස්වීමේ අයිතිය සම්පූර්ණයෙන් භුක්ති විඳීම සඳහා මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින්, මැතිවරණ නිරීක්ෂකයින් සහ රැස්වීම් නිරීක්ෂණය කිරීම හෝ වාර්තා කිරීම සම්බන්ධ වෙනත් පුද්ගලයින්ගේ කාර්යභාරය විශේෂ වැදගත්කමක් දරණ බවයි.

1.4 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය මගින් සපයා ඇති පරිදි, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සඳහා මාධ්‍යවේදීන්ට හිමිකමක් ඇත. එබැවින්, මෙම අයිතිය නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ආරක්ෂා කළ යුතුය. විරෝධතා පැවැත්වෙන ස්ථානවල සිටින මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව විසින් ප්‍රමාණවත් ලෙස හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

1.5 තම රාජකාරිය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා විරෝධතා වලදී මාධ්‍ය වෙත පැමිණීමට ඉඩ සැලසීම සඳහා අනුගමනය කළ යුතු පහත ක්‍රියාමාර්ග කොමිසම නිර්දේශ කරයි.

1.5.1. මාධ්‍යවේදීන් විසින් පොලිස් මෙහෙයුම අවේක්ෂණය කිරීම සහ පටිගත කිරීම වැළැක්විය යුත්තේ (අත්‍යන්තයෙන්ම) ඔවුන් අඛණ්ඩව එම ස්ථානයේ රැඳී සිටීම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ කාර්යයට සැලකිය යුතු ලෙස බාධාවක් හෝ වැලැක්වීමක් වන්නේ නම් පමණි. එවැනි අවස්ථාවලදී මාධ්‍යයට පැහැදිලි උපදෙස් සහ විසිර යාමට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුය. ජනරාශිය ප්‍රමාණවත් ලෙස ආවරණය කිරීමට ඔවුන්ට අවකාශය ලබා දිය යුතුය. මාධ්‍ය නියෝජිතයන් නීත්‍යානුකූල විසුරුවා හැරීමේ නියෝගයක් පිළිපැදීම ප්‍රතික්ෂේප කළහොත්, පොලිසියට සමානුපාතිකව ප්‍රතිචාර දැක්විය හැකිය.

1.5.2. මාධ්‍යවේදීන්ට උද්ඝෝෂණයකට සහභාගිවන්නන්ගෙන් වෙන්කර හඳුනාගැනීම සඳහා ප්‍රායෝගික අන්දමින් හැකි තාක් දුරට යම් හඳුනාගැනීමේ සංකේතයක් තිබිය යුතුය. වෙන් කොට හඳුනා ගත හැකි ඇඳුම් ඇඳීම හෝ ඉදිරිපත් කළ හැකි හැඳුනුම්පතක් රැගෙන යාම මෙයට ඇතුළත් විය හැකිය.

1.5.3.මාධ්‍ය නියෝජිතයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ දී, නීතිවිරෝධී ලෙස බලය භාවිතා කරන ලද අනෙකුත් සෑම අවස්ථාවකදී මෙන්ම, පුළුල් හා ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, අවශ්‍ය නම්, අපරාධ චෝදනා ඉදිරිපත් කර මාධ්‍යවේදීන්ට සහ අනෙකුත් මාධ්‍යවේදීන්ට එරෙහිව අපරාධ සිදු කළ අපරාධකරුවන්ට සියලු දෙනා නීතිය ඉදිරියටගෙන ඒමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

1.5.4.විරෝධතා ආවරණය කිරීමට, පටිගත කිරීමට සහ වාර්තා කිරීමට මාධ්‍යයට ඇති අයිතිය ආරක්ෂා කළ යුතුය.

1.5.4.1. කිසියම් ප්‍රවෘත්ති සේවාවක (අන්තර්ජාල, මුද්‍රිත, ගුවන්විදුලි හෝ රූපවාහිනිය) හඳුනාගත් මාධ්‍යවේදීන් විරෝධතා භූමියට ප්‍රවේශ වීම නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

1.5.4.2. නිලධාරීන් විසින් බලයලත් මාධ්‍ය නියෝජිතයින්ට පහර දීම, මාධ්‍ය නියෝජිතයින් විසින් මහජනතාවට සන්නිවේදනය කිරීම සඳහා තොරතුරු එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ සැකසීමට බාධා කිරීම හෝ වැලැක්වීම නොකළ යුතුය.

1.5.4.3. මාධ්‍යවේදීන් විසින් විරෝධතා භූමියට ගෙන එන මාධ්‍ය උපකරණ වලට කිසිඳු හානියක් හෝ විනාශ කිරීමක් සිදු නොවන බවටත්, එහි භාවිතයට කිසිදු ආකාරයකින් බාධාවක් ඇති නොවන බවටත් නිලධාරීන් සහතික විය යුතුය (උදා: කැමරා කාචයක් ආවරණය කිරීම අනුමත කල නොහැක).

1.5.4.4. විසුරුවා හැරීමේ නියෝගයක් ලබා දීමෙන් පසුව වුවද, පැහැදිලිව හඳුනාගත් මාධ්‍යවේදීන්ට අත්අඩංගුවට ගැනීම් සිදු වන අවස්ථාවලදී පවා විරෝධතා භූමිය තුළ රැඳී සිටිමින් ඔවුන්ගේ වෘත්තීය රාජකාරි ඉටු කිරීමට අවසර දෙනු ලැබේ.

1.6. නිලධාරීන් මාධ්‍ය සමඟ සහ ඔවුන් හරහා මහජනතාව සමඟ වඩා හොඳ සබඳතා ඇති කර ගැනීම සඳහා කට යුතු කල හැකි ආකාරය නම්;

1.6.1. මාධ්‍ය ප්‍රවේශය සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම:
1.6.2. මාධ්‍ය නියෝජිතයන් සඳහා වේදිකාවක් ස්ථාපිත කිරීම.
1.6.3. මාධ්‍ය වල සංචරණය හා උපකරණ ස්ථානගත කිරීම සම්බන්ධයෙන් සහය වීම.

1.7 උද්ඝෝෂණවල දී මෙම ආරක්ෂාව සහතික කෙරු මාධ්‍ය වන්නේ තමන් සමඟ වලංගු හැඳුනුම්පතක් තිබෙන පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව ගෞරවාන්විතව අනන්‍යතා සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින අවස්ථාවේදී එවැනි හැඳුනුම්පතක් ඉදිරිපත් කල හැකි මාධ්‍යවේදීන්ට පමණි. (උදා: මාධ්‍ය උපකරණ පමණක් රැගෙන යන පුද්ගලයකුට එම ආරක්ෂාව හිමි නොවේ).

1.8 මාධ්‍ය විසින් ප්‍රකෝපයට පත් කිරීම පොලිසිය හෝ ත්‍රිවිධ හමුදාව විසින් මාධ්‍යවේදීන්ට පහර දීම සඳහා හේතු සාධකයක් නොවේ.

1.9 මාධ්‍ය නියෝජිතයන් ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරන ක්‍රියාකාරකම්වල යෙදෙන්නේ නම්, ඉහත සඳහන් නිර්දේශිත මාර්ගෝපදේශනයන්හි සඳහන් කිසිවක් පොලිසියට සහ ත්‍රිවිධ හමුදාවට නීතිය ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවන බව දැන සිටීම ඉතා වැදගත්ය.

**2. පූජ්‍ය පක්ෂය**

විරෝධතාවලට සහභාගි වන පූජ්‍ය පක්ෂයේ සාමාජිකයන් ප්‍රචණ්ඩකාරී තත්වයට පත් නොවන්නේ නම්, ඔවුන්ට ලැබිය යුතු උපරිම ගෞරවයෙන් සැලකිය යුතුය.

**3.අසල රැඳී සිටින්නන්**

3.1 ප්‍රදේශයේ විශාල ජනකායක් සිටින විට විරෝධතාකරුවන් නරඹන්නන්ගෙන් වෙන්කර හඳුනා ගැනීම දුෂ්කර බව පිළිගැනේ.

3.2 හැකි තාක් ප්‍රයෝගිකව, අවට සිටින අයට බාධාවකින් තොරව නිදහසේ ගමන් කිරීමට ඉඩ දිය යුතුය. කොමිසමේ නිර්දේශය නම්,

3.2.1. අවට සිටින අයට උද්ඝෝෂණය මග හැර ආරක්ෂිත මාර්ග සොයා ගැනීමට ඉඩ සැලසීම සඳහා නිලධාරීන් පියවර ගත යුතුය. සුදානම් වීමේ අදියරේදී මෙම මාර්ග නිලධාරීන් විසින් තීරණය කළ යුතුය.

3.2.2. නීතිවිරෝධී විරෝධතාවයක නියැලීමේ නීතිමය ප්‍රතිවිපාක සඳහන් කරමින්, අසල සිටින අයටද ඇසෙන පරිදි නිලධාරීන් මෙගාෆෝන් හරහා සමූහයා සමඟ සන්නිවේදනය කළ යුතුය.

3.2.3. දැඩි ජනරාශි පාලන ක්‍රම භාවිතා කිරීමට පෙර අසල රැඳී සිටිනන්නට බලපෑම් එල්ල නොවන බවට හෝ නිලධාරීන් විසින් වැරදි ලෙස අත් අඩංගුවට ගැනීම සිදු නොවන බවට සහතික වීම සඳහා එවැනි අනතුරු ඇඟවීම් සැපයිය යුතුය.,

## VI. රාජ්‍ය සතු දේපළයන්ට, පොදු හෝ පුද්ගලික දේපළයන්ට හානි පමුණුවමින් අපරාධමය වැරදි සිදු කිරීම සහ අනවසරයෙන් රැඳීසිටීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම

### i. නීති විරෝධී ලෙස රැඳී සිටීම සහ දේපල වලට සාපරාධී හානි කිරීම වැළැක්වීම

2022 මැයි 9 සහ ජුලි 9 යන දෙදින තුළ සිදු වූ විනාශකාරී සිදුවීම්වලට තුඩු දුන් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් දේපළ නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම සහ දේපළවලට සාපරාධී හානි වැළැක්වීම සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කෙරේ.

1. සිදු වීමට ඉඩ ඇති ප්‍රහාරයක් සම්බන්ධයෙන් පොලිසිය තොරතුරු ලබා ගත් විට හෝ ලැබුණු විට, එවැනි තොරතුරු බරපතල ලෙස සැලකිය යුතු අතර පුද්ගලිකව පොලිසිය වෙත ළඟා වන පුද්ගලයින්ට ප්‍රතිචාරය දැක්විය යුතු වේ.

2. අදාල ප්‍රදේශයේ පොලිස් බලය ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් සිදු වීමට ඉඩ ඇති ප්‍රචණ්ඩකාරී සිදුවීමක් හෝ සැබවින්ම ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීමක් පිළිබඳ තොරතුරු ලැබුණු වහාම ආරක්ෂක සැලැස්මක් සකස් කළ යුතු අතර පැහැදිලි අණදෙන ධුරාවලියක් ස්ථාපිත කළ යුතුය.

3. අදාළ විරෝධතාවයට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කරන ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ මට්ටම දක්වා ඉහත කරුණු අණ දීමේ ධුරාවලිය හරහා බෙදාගත යුතුය.

4. සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ පනතේ 95(3) වගන්තියට අනුව විරෝධතාකරුවන් විසින් එල්ල කරන තර්ජනයේ ස්වභාවය අනුව පොලිසිය විසින් ත්‍රිවිධ හමුදාවේ සහාය ලබාගත යුතුය. කෙසේ වෙතත්, මහජන ආරක්ෂක ආඥාපනතේ 2 සහ 12 වගන්තිවලට අනුව සහ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 96 වැනි වගන්තිය ප්‍රකාරව ඇඳිරි නීතිය හෝ හදිසි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවක එවැනි ආරාධනයක් නොමැතිව ත්‍රිවිධ හමුදාවට ජනරාශි පාලනය කිරීමට සහභාගී විය හැකිය.

5. තර්ජනයට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවකින් යුත් නිලධාරීන්ගෙන් සමන්විත පොලිස් ඒකක සමඟ ත්‍රිවිධ හමුදා ඒකක (අවශ්‍ය විට) යෙදවිය යුතුය.

6.නිලධාරීන් හැකිතාක් පිරිස සමඟ සංවාදයේ යෙදීමට කටයුතු කල යුතු අතර, විසිර යෑමට ඔවුන් ඒත්තු ගැන්විය යුතුය. එය අසාර්ථක වුවහොත්, ජනරාශියට ඔවුන්ගේ අපේක්ෂිත ක්‍රියාවන්හි නීතිමය ප්‍රතිවිපාක මතක් කළ යුතුය.

7. එම ස්ථානයට යොදවා ඇති නිලධාරීන් විරෝධතා භූමියේ අණදෙන නිලධාරියාගේ අණ පරිදි භාවිතා කළ යුතු දැඩි නොවන පාලන ක්‍රම (මාර්ගෝපදේශවල පාලන ක්‍රම යටතේ සඳහන්), මාරාන්තික නොවන ආයුධ සහ මාරාන්තික අවිවලින් ප්‍රමාණවත් ලෙස සන්නද්ධ විය යුතුය. .

8. එම ස්ථානයේ සිටින අණදෙන නිලධාරියා විසින් එසේ කිරීමට නියෝග කරන්නේ නම් මිස, එම ස්ථානයේ සිටින නිලධාරීන් අණ දීමේ ධුරාවලිය කඩ නොකළ යුතු වේ.

9. නිලධාරීන් අනියුක්ත වීමට ප්‍රථම, සාපරාධීව දේපළවලට හානි කිරීම සහ දේපළ නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම වැළැක්වීම සඳහා නීත්‍යානුකූලව නීතිමය ප්‍රතිවිපාකවලට බිය නොවී ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් විය යුතුය (මෙය දැනුවත් කිරීමේ වැඩමුළු හරහා පොලිස් පුහුණුවට ඇතුළත් කළ යුතුය)

10. දේපළ ආරක්ෂා කිරීමට ඇති වගකීම කඩ කරන සහ අණදෙන නිලධාරියෙකුගේ නියෝගය ප්‍රතික්ෂේප කරන නිලධාරියෙකු හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ගවලට යටත් කළ යුතුය.

11. සාපරාධී අනවසරයෙන් ඇතුළුවීම, නීතිවිරෝධී ලෙස පරිශ්‍ර අත්පත් කර ගැනීම සහ දේපළ හානි වැළැක්වීම පොලිසියට සහ ත්‍රිවිධ හමුදාවට රාජකාරිය පැවරී ඇති විට, ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයාගෙන් අධිකරණ නියෝගයක් ලබා ගත යුතුය.

12.අවශ්‍ය බලය යෙදවීමට පෙර විරෝධතාකරුවන් එම පරිශ්‍රයෙන් පිටවිය යුතු කාල රාමුව පිළිබඳව නීති විරෝධීව රැඳී සිටින්නන් දැනුවත් කිරීම සඳහා අධිකරණ නියෝගය විරෝධතාකරුවන්ට ඉදිරිපත් කළ යුතු අතර එම නියෝගය මාධ්‍ය වෙතද නිකුත් කළ යුතු වේ. එකම අනතුරු ඇඟවීම කිහිප විටකදී නිකුත් කරන්න.

**ii. නීතිවිරෝධීව රැඳී සිටින්නන් එම පරිශ්‍රයෙන් ඉවත් කිරීම**

1. නීති විරෝධීව දේපළ අත්පත් කර ගැනීම දැනටමත් සිදුවී ඇති විට, විරෝධතාකරුවන් නීතියේ සීමාවෙන් බැහැරව කටයුතු කරමින් සිටි.

2. නීතිවිරෝධී විරෝධතාකරුවන් ඉවත් කිරීම සිදු කිරීම සඳහා ජනරාශි පාලනය කිරීමේ ක්‍රම භාවිතා කළ හැකි අතර, නීතියේ සීමාවන්ට යටත්ව පවතින තත්වයන් යටතේ සාධාරණ ලෙස අවශ්‍ය වූ විට පමණක් බලය භාවිතා කළ හැකිය.

3. විරෝධතාකරුවන් පරිශ්‍රයෙන් ඉවත් වීමට පටන් ගෙන ඇති බව පෙනී ගිය පසු, පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව ඔවුන්ගේ ඉවත් කිරීමේ උත්සාහයන් නවතා ඉවත් කිරීමේ මෙහෙයුම දැන් අවසන් වී ඇති බැවින් විරෝධතාකරුවන්ට පිටව යාමට ඉඩ දිය යුතුය.

## VII. ඇඳිරි නීතිය හෝ හදිසි නීතිය ක්‍රියාත්මකව ඇති අවස්ථාවක උද්ඝෝෂණයන් පවතින විට ක්‍රියාත්මක විය යුතු ආකාරය

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(h) වගන්තිය යටතේ සියලුම පුරවැසියන්ට යාම් ඊම් නිදහස සහතික කර ඇත. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) වගන්තිවලට අනුව ජාතික ආරක්ෂාව සඳහා එය සීමා කළ හැකිය.

2. යම් ප්‍රදේශයක ඇඳිරි නීතිය හෝ හදිසි නීතිය ක්‍රියාත්මක වන විටදී විශ්වාසනීය මූලාශ්‍ර හරහා, එය උල්ලංඝනය කිරීමක් සිදුවිය හැකි බව පෙනී යන විට, කොමිෂන් සභාව නිර්දේශ කරන්නේ:

2.1 හදිසි ආරක්ෂාව පවතින අවස්ථාවකදී පවා මාර්ග දෙපස ආරක්ෂක මුරපොලවල් පිහිටුවීමේදී මෙය අත්තනෝමතික ලෙස යාම් ඊම් නිදහස උල්ලංඝනය වන අයුරින් සිදු නොකිරීම ඉතා වැදගත් වේ (Rodrigo v Imalka, SI Kirulapone, SC (FR) No. 297/2007 S.C. Minute of 03.012. 2007).

2.2 අදාල ප්‍රදේශයේ පොලිස් බලය ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා සිය නිලධාරීන් සංවේදී ප්‍රදේශවල නිරන්තර මුර සංචාරයේ යෙදවිය යුතුය.

2.3 අන්තර් දිස්ත්‍රික් සම්බන්ධීකරණයට පහසුකම් සැලසීම සඳහා එම ස්ථානාධිපතිවරයා විසින් ප්‍රචණ්ඩකාරී හෝ දේපල විනාශ කිරීම් වැනි සිදුවීම් සිදුවිය හැකි ප්‍රදේශ හඳුනාගෙන එය පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අවධානයට යොමු කළ යුතුය.

2.4 ඕනෑම ආකාරයක ප්‍රචණ්ඩත්වය බරපතල ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවන බව ගුවන්විදුලි, රූපවාහිනී සහ සමාජ මාධ්‍ය වේදිකා ඇතුළු නිල වෙබ් අඩවි හරහා විකාශනය කිරීමට සියලුම පොලිස් නිලධාරීන් උපරිම උත්සාහයක් ගත යුතුය.

2.5 ඇඳිරි නීතිය කඩකරන්නන් පොලිස් අත්අඩංගුවට ගැනීම සහ ඇඳිරි නීතිය පවතින කාලය තුළ පවා නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීම සංශෝධිත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට අනුකූලව සිදු කළ යුතුය.

2.6 හදිසි නීතිය ක්‍රියාත්මක වන විට පවත්වන උද්ඝෝෂණවලදී පොලිසියේ ආරාධනයකින් තොරව ජනරාශි පාලනය කිරීමට ත්‍රිවිධ හමුදාවට හැකියාව තිබුනද පොලිසිය සමඟ සන්නිවේදනය හා සම්බන්ධීකරණය කිරීම තුලින් එසේ සිදු කිරීම යෝග්‍ය වේ

## III කොටස: ක්‍රියාවට නැංවීම

1. සිවිල් විරෝධතා වලදී තම රාජකාරි ඉටු කිරීමේදී පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව විසින් කොමිෂන් සභාවේ ඉහත නිර්දේශිත මාර්ගෝපදේශ සැලකිල්ලට ගත යුතු බව නිර්දේශ කෙරේ.
2. කොමිෂන් සභාව සමඟ අඛණ්ඩව සාකච්ඡා කරමින් මෙම නිර්දේශිත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

3. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීමට පහත ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

3.1 කොමිෂන් සභාවේ නිර්දේශිත මාර්ගෝපදේශ කිසිදු අවහිරතාවයකින් තොරව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් මුද්‍රිත ස්වරූපයෙන් සහ නිල වෙබ් අඩවිවල බාගත කළ හැකි ආකෘතියකින් ලබා ගැනීමට ඉඩ සැලසිය යුතු වේ. .

3.2 පොලිස්පතිවරයා සහ ත්‍රිවිධ හමුදාපතිවරුන් සමඟ සාකච්ඡා කර දැනට පවතින පොලිස් මාර්ගෝපදේශ සංශෝධනය කිරීම සහ සිවිල් විරෝධතා වලදී ජනරාශි පාලනය කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් නිර්දේශිත මාර්ගෝපදේශ ඇතුළත් කර, ත්‍රිවිධ හමුදාව සඳහා නව මාර්ගෝපදේශ සකස් කිරීම.

3.3 කොමිෂන් සභාව සහ පොලිස් සහ ත්‍රිවිධ හමුදාවේ ජාත්‍යන්තර මානුෂීය නීති (IHL) දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණයට පහසුකම් සැලසීම.

3.4 නව නිර්දේශිත මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම.

3.5 ජනරාශි පාලන නිර්දේශිත මාර්ගෝපදේශ පිළිබද ද්විවාර්ෂික පදනමින් නැවුම් පාඨමාලා සිදු කරන්න.

3.6 විරෝධතා වලදී විශේෂ සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සමඟ කටයුතු කරන ආකාරය පිළිබඳ උපදෙස් පත්‍රිකා නිර්මාණය කිරීම සහ බෙදා හැරීම.

3.7 විරෝධතා වලදී ජනරාශි පාලනය කිරීමේ විවිධ පැතිකඩ පිළිබද විනාඩි 15 - 30 කාලසීමාවේ වීඩියෝ දර්ශන නිර්මාණය කිරීම, සහ ඒවා නැරඹීම පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ට අනිවාර්ය කිරීම.

3.8 මෙම නිර්දේශිත මාර්ගෝපදේශවල ප්‍රායෝගික භාවිතය සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම සඳහා පොලිසියේ සහ ත්‍රිවිධ හමුදාවේ පුහුණු වැඩසටහන්වලට අනුකරණය කළ සිවිල් විරෝධතා පුහුණුව ඇතුළත් කරන්න.